# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 75 — 1973 අගෝස්තු 31 වැනි සිකුරාදා — 1973.08.31

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (II ආ) වැනි ඡේදය — පලකිරීම්


| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම ... ... ... | 1133 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | 1157 |
| තීරණය කළ ටෙන්ඩර්පත් පිළිබඳ දැන්වීම ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහාවූ අයදුම් පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1154 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | 1157 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


**සැළකිය යුතුයි.**—(i) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 31 දරන ශ්‍රී ලංකා පදනම් පනත, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 32 දරන උද්භිද උද්‍යාන (සංශෝධන) පනත සහ ජාතික රාජ්‍ය සභාවේ1973 අංක 33 දරන ණය මණ්ඩල (සංශෝධන) පනත 1973 අගෝස්තු 31 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වනකොටසේ අතිරේකයන් වශයෙන් පළවේ. (ii) මහනුවර තරුණ බෞද්ධ සමිති පනත් කෙටුම්පත 1973 අගෝස්තු 24 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයන්ගේ සහ උපදේශකවරුන්ගේ නාම ලේඛනයක්ද පළවේ.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

"ජර්සි ෆ්‍රුල් ඕවර්ස්" සැපයීමේ ටෙන්ඩරය

කොළඹ 2, තැ. පෙ. 594, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතෙහි පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් නිල් අළු පැහැයෙන් යුත් "ජර්සි ෆ්‍රුල් ඕවර්ස්" 350ක් සැපයිම සඳහා 1973 සැප්තැම්බර් මස 21 වෙනි දින පෙරවරු 10 තෙක් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. මෙම සැපයිමට අදාල සාම්පලයක් ගුවන් හමුදා මූලස්ථානයේ ටෙන්ඩර් අංශයේදී පරීක්ෂා කළ හැක. ටෙන්ඩර් පත් ලබා ගැනීමට ප්‍රථම මෙම මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරී වෙත නැවත ලබාගත හැකි රු. 100 ටෙන්ඩර් තැන්පත් මුදලක් ඉදිරිපත් කළ යුතු වේ. 1973 සැප්තැම්බර් මස 20 වෙනි දින දහවල් 12 තෙක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

3. වැඩි විස්තර කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුද මූලස්ථානයෙන් දැනගත හැක.

පී. එච්. මැන්දිස්,
එයාර් කොමඩෝර්,
ගුවන් හමුදාපති.

8–1247—73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

---

වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලය.

ටෙන්ඩර් දැන්වීම් අංක: 6/73

**මැනිලා කඹ**

මැනිලා කඹ සැපයිම සඳහා සිල් තබන ලද ටෙන්ඩර්, කොළඹ වරාය සංයුක්ත මණ්ඩලයේ ඉංජිනේරු කළමනාකරු විසින් කැඳවනු ලැබේ.

ටෙන්ඩර් භාර ගැනිම 1973 සැප්තැම්බර් 14 දින ප. ව. 2.30 ට අවසන් වනු ඇත.

වැඩි විස්තර සහ ටෙන්ඩර් ෆෝර්ම කොළඹ 1, පල්ලියවිදියේ වරාය සංයුක්ත මණ්ඩලයේ පාලන ලේකම් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක.

8-1190—73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශෙෂ නිවේදනයයි**

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පලවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පලවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

### ශ්‍රී ලංකා නාවික හමුදව — ආහාර ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර්

1974 ජනවාරි මස 01 වැනි දින සිට 1974 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා (මාස 12) තුල පහත සඳහන් සැපයීම් සේවා සඳහා කොළඹ 1, තැ.පෙ. 593, කොඩිගහ විදියේ, ශ්‍රී ලංකා නාවික හමුදවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ඒ ඒ සැපයීම ඉදිරියෙන් දක්වා ඇති දිනයන්හි පෙරවරු 10.00 තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

| (I) සැපයීම | (II) ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරන අන්තිම දිනය | (III) ටෙන්ඩර් භාරගන්නා අන්තිම දිනය | (IV) ටෙන්ඩර් ආකෘති පත්‍ර විවෘත කිරීම |
|---|---|---|---|
| (අ) *ත්‍රිකුණාමලයේ, යුධ හමුදවට, ශ්‍රී ලංකා නාවික හමුදවට සහ ශ්‍රී ලංකා ගුවන් හමුදවට මස් සැපයීම | දවල් 12.00 1973.09.17 | ... පෙ.ව. 10.00 1973.09.20 | ... පෙ.ව. 10.30 1973.09.20 |
| (ආ) *ත්‍රිකුණාමලයේ, යුධ හමුදවට, ශ්‍රී ලංකා නාවික හමුදවට, ශ්‍රී ලංකා ගුවන් හමුදවට අළුත් මාලු සැපයීම | දවල් 12.00 1973.09.17 | ... පෙ.ව. 10.00 1973.09.20 | ... පෙ.ව. 10.30 1973.09.20 |
| (ඇ) *කොළඹ, යුධ හමුදවට, ශ්‍රී ලංකා නාවික හමුදවට සහ ශ්‍රී ලංකා ගුවන් හමුදවට අළුත් මාලු සැපයීම | දවල් 12.00 1973.09.17 | ... පෙ.ව. 10.00 1973.09.20 | ... පෙ.ව. 10.30 1973.09.20 |
| (ඈ) කොළඹ ශ්‍රී ලංකා නාවික හමුදවට උදය ආහාර වර්ග සැපයීම ... ... | දවල් 12.00 1973.09.18 | ... පෙ.ව. 10.00 1973.09.21 | ... පෙ.ව. 10.30 1973.09.21 |
| (ඉ) රාගම, වැලිසර, ශ්‍රී ලංකා නාවික හමුදවට මස් සැපයීම ... ... ... | දවල් 12.00 1973.09.18 | ... පෙ.ව. 10.00 1973.09.21 | ... පෙ.ව. 10.30 1973.09.21 |
| (ඊ) රාගම, වැලිසර, ශ්‍රී ලංකා නාවික හමුදවට අළුත් මාලු සැපයීම ... ... | දවල් 12.00 1973.09.18 | ... පෙ.ව. 10.00 1973.09.21 | ... පෙ.ව. 10.30 1973.09.21 |
| (උ) රාගම, වැලිසර, ශ්‍රී ලංකා නාවික හමුදවට එලවලු, පොල් සහ කිරි පට්ටි නිෂ්පාදන සැපයීම... | දවල් 12.00 1973.09.18 | ... පෙ.ව. 10.00 1973.09.21 | ... පෙ.ව. 10.30 1973.09.21 |
| (ඌ) රාගම, වැලිසර, ශ්‍රී ලංකා නාවික හමුදවට උදය ආහාර වර්ග සැපයීම ... ... | දවල් 12.00 1973.09.18 | ... පෙ.ව. 10.00 1973.09.21 | ... පෙ.ව. 10.30 1973.09.21 |
| (එ) යාපනයේ, කාරෙයිනාගර්හි, ශ්‍රී ලංකා නාවික හමුදවට උදය ආහාර වර්ග, එලවලු, පොල් සහ කිරි පට්ටි නිෂ්පාදන සැපයීම | දවල් 12.00 1973.09.19 | ... පෙ.ව. 10.00 1973.09.24 | ... පෙ.ව. 10.30 1973.09.24 |
| (ඒ) යාපනයේ, කාරෙයිනාගර්හි ශ්‍රී ලංකා නාවික හමුදවට අළුත් මාලු සහ මස් සැපයීම ... | දවල් 12.00 1973.09.19 | ... පෙ.ව. 10.00 1973.09.24 | ... පෙ.ව. 10.30 1973.09.24 |
| (ඔ) තංගල්ලේ, ශ්‍රී ලංකා නාවික හමුදවට උදය ආහාර වර්ග, එලවලු, පොල්, කිරි පට්ටි නිෂ්පාදන, අළුත් මාලු සහ මස් සැපයීම | දවල් 12.00 1973.09.19 | ... පෙ.ව. 10.00 1973.09.24 | ... පෙ.ව. 10.30 1973.09.24 |
| (ඔ) කල්පිටියේ ශ්‍රී ලංකා නාවික හමුදවට උදය ආහාර වර්ග, එලවලු, පොල්, කිරිපට්ටි නිෂ්පාදන, අළුත් මාලු සහ මස් සැපයීම | දවල් 12.00 1973.09.19 | ... පෙ.ව. 10.00 1973.09.24 | ... පෙ.ව. 10.30 1973.09.24 |
| (ක) ලක්ෂපාන, ශ්‍රී ලංකා නාවික හමුදවට උදය ආහාර වර්ග, එලවලු, පොල්, කිරි පට්ටි නිෂ්පාදන, අළුත් මාලු සහ මස් සැපයීම | දවල් 12.00 1973.09.19 | ... පෙ.ව. 10.00 1973.09.24 | ... පෙ.ව. 10.30 1973.09.24 |

2. අයදුම්කරුගේ මුදල් තත්ත්වය සහ මෙම සේවා කර ගෙන යාමේ හැකියාව පිළිබඳව සම්පූර්ණ විස්තරයක් සහිතව ඉදිරිපත් කරන ලිඛිත අයදුමක් මත, ඉහත සඳහන් සැපයීම් සේවා සඳහා ටෙන්ඩර් ආකෘති පත් ඒ ඒ සැපයීම ඉදිරියෙහි II වන තීරයෙහි දක්වා ඇති දිනයන්හි මධ්‍යාහ්නයේ 12.00 දක්වා කොළඹ, තැ.පෙ. 593, කොඩිගහ විදියේ, ශ්‍රී ලංකා නාවික හමුද මූලස්ථානයේ නාවික හමුදාධිපති විසින් නිකුත් කරනු ලැබේ.

3. ඉහත සඳහන් එක් එක් සැපයීම් සේවා සඳහා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට මත්තෙන් රු. 75.00 බැගින්, නැවත ලබාගත හැකි ටෙන්ඩර් තැන්පත් මුදලක් නාවික හමුද මූලස්ථානයේ දී ගෙවිය යුතුයි. චෙක් පත් භාරගනු නොලැබේ. මුදල් ඇණවුම නාවික හමුදාධිපති නමින් විය යුතුයි.

4. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම්කරුවන් තම තමන්ගේ සම්පූර්ණ නම සහ ලිපිනයන් ඉදිරිපත් කල යුතුය.

5. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම්කරුවන් තමන් ටෙන්ඩර් කිරීමට කැමති ඒ ඒ සැපයීම සහ ස්ථානය සඳහන් කිරීම අවශ්‍යය.

*ත්‍රිවිධ හමුදවන් සඳහා ටෙන්ඩර්.

ඩී. බී. ගුණසේකර,
කොමදෝරු,
නාවික හමුදාධිපති.

නාවික ආහාර අංශය,
ශ්‍රී ලංකා නාවික හමුද මූලස්ථානය,
තැ.පෙ. 593,
කොළඹ 1,
1973 අගෝස්තු මස 18වැනි දින දීය.

8–1147—73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

---

### ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සේවය

#### කලාවැව කොටස (මහ ඉලුප්පල්ලම)

උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ කලාවැව කොටසේ (මහඉලුප්පල්ලම) පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් අයදුම්පත් උතුරු මැද දිසාවේ වැඩ අධ්‍යක්ෂතැන විසින් 1973 සැප්තැම්බර් මස 21 වැනි දින පෙරවරු 10.30 දක්වා භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එදින එවේලේම එහිදී සිදු කෙරේ.

| වැඩයේ නම | | | | කොන්ත්‍රාත්කරු ලියාපදිංචි වියයුතු ගණය | | ටෙන්ඩර් තැන්පත් මුදල |
|---|---|---|---|---|---|---|
| | | | | රු. ශ. | | රු. ශ. |
| 1. අංක 8 තුලානේ රොටවැව වැඩි දියුනු කිරීම ... | — | — | — | 35,000 0 | ... | 50 0 |
| 2. අංක 12 තුලානේ හැළඹවැටිය වැව වැඩිදියුනු කිරීම | — | — | — | 18,000 0 | — | 25 0 |
| 3. අංක 9ඒ තුලානේ හැළඹවැව වැඩිදියුනු කිරීම | — | — | — | 16,000 0 | — | 25 0 |

2. වාරිමාර්ග හා මහාමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, කම්කරු සමිතිවලට, සමූපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මේ සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කළහැක.

3. 1973 සැප්තැම්බර් 18 වැනි දින දක්වා කලාවැව කොටස (මහඉලුප්පල්ලම) මරදන්කඩවල, කැකිරාව, අනුරාධපුරය සහ නොච්චියගම විධායක ඉංජිනේරු කාර්යාලවලින් කාර්යාල වේලාතුලදී ලබාගත හැකි ටෙන්ඩර් ෆෝර්මවල අයදුම්පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් කිරීම සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර්කරුවන්ගේ ලියා පදිංචි පොත් සහ දනට කර ගෙන යන වැඩ සහ ඒවායේ වටිනාකම් දැක්වෙන ප්‍රකශනායන්, ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලබාදිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා විධායක ඉංජිනේරුතැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ෆෝර්ම ඉදිරිපත් කිරීමට පෙර මෙම වැඩය සඳහා සඳහන් කර ඇති ටෙන්ඩර් තැන්පත් මුදල ඉහත කී විධායක ඉංජිනේරු කාර්යාලවලදී හෝ ලංකාවේ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ලබාගත් කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුය.

4. මෙම වැඩය ගැන සියලුම විස්තර, සැලසුම් ආදිය කාර්යාල වේලාවන් තුලදී කලාවැව කොටස (මහඉලුප්පල්ලම) විධායක ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගත හැක.

වී. රෙගුනාදන්,
විධායක ඉංජිනේරු, කලාවැව කොටස.

1973.08.20 වැනි දින,
කලාවැව විධායක ඉංජිනේරු කාර්යාලය,
මහඉලුප්පල්ලම දීය.

8–1252—73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

---

### කෑගල්ල විශේෂ කොමසාරිස් කාර්යාලය

පහත උප ලේඛණයේ සඳහන් කර්මාන්තය සඳහා මුද්‍රා තබන ලද, ටෙන්ඩර් අනු පිටපත් සහිතව 1973.09.07 දින පෙරවරු 10.00 දක්වා ම විසින් භාරගනු ලැබේ.

මෙම ආයතනයේ හෝ වෙනත් රජයේ දෙපාර්තමේන්තුවක, එම කර්මාන්තය ඉදිරියෙන් දක්වා ඇති මුදලට ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන් ගෙන් පමණක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

ටෙන්ඩර් ආකෘති පත්‍ර 1973.09.06 දින පෙරවරු 12.00 දක්වා නිකුත් කරනු ලැබේ.

අවශ්‍ය වැඩි විස්තර කාර්යාල වේලාවන්හිදී පැමිණ දැනගත හැක.

1973.8.15 වෙනි දින,
කෑගල්ල විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

එච්. ජී. ආනන්ද,
කෑගල්ල නගරයේ විශේෂ කොමසාරිස්.

උප ලේඛණය

| | ටෙන්ඩර් තැන්පත් මුදල | ටෙන්ඩර් ෆෝර්ම ගාස්තු | ලියාපදිංචි වියයුතු මුදල |
|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| කෑගල්ල තානායම වැඩි දියුණු කිරීම (පළමු වන පියවර) | ... 250 0 | ... 50 0 | ... 50,000 0 |

8–1194—73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

---

### සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

#### ජාතික කිරි ව්‍යාපාරය—පිරිසිදු එළකිරි එහා මෙහා ගෙනයාම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.**—වර්ෂ 1974.1.1 සිට 1974.12.31 වැනිද දක්වා (දෙදින ඇතුළුව) කාලය තුළ මේ සමඟ ඇති උපලේඛණයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන, ආයතනයන්ට, සෞඛ්‍ය කාර්යාලවල සිට කිරි මධ්‍යස්ථාන වලට පිරිසුදු එළ කිරි ගෙනයාම සඳහා ලාංකික යන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම් විසින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (අ) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උප ලේඛනයෙහි දෙවන ඡේදයෙහි සඳහන් පරිදි, රු. 100ක තැන්පත් මුදලක් මා නමට කච්චේරියේ තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

(ආ) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුර, බදුල්ල, මඩකලපුව, ගාල්ල, යාපනය, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි වරුන්ගේ කාර්යාල වලින් හෝ ලබාගත හැක. නියමිත ෆෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් ෆෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් ෆෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි ෆෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—මෙම දෙපාර්තමේන්තුවේ දනට කොන්ත්‍රාත්තුවක් නොදරණ අය ටෙන්ඩර් ෆෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ සැලකිය යුතු කාලයකට පළමු තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් ෆෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීනට හෝ දන්විය යුතුය. මේ සඳහා වුවමනා ෆෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු එළකිරි ප්‍රමාණයන් දළ වශයෙන් දන ගැනීමට මේ සමඟ ඇති උප ලේඛණයෙහි 3 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " සෞඛ්‍ය සේවා අධිකාරි කොළඹ " කියා එවිය යුතුයි. සීල් කරණ ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙලවරේ එය කවර සේවාවන් සඳහාද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම, එහි වම්පස පහත කෙලවරේ ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය, පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරි මහතාට දීමෙන් එය ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන් සියක් ගැනීමෙන් හෝ ලියා පදිංචි තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැකිය.

6. **ටෙන්ඩර්පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උප ලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර්පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර්පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර් කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර් කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර් කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙළ කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයේ සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර් කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත්වන තුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුල වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු නියමිත ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දනගත යුතුවාක් හැර පිළිපැදිය යුතුද වන්නේ ය.

11. **වෙනත් විස්තර.**—තවදුරටත් විස්තර දන ගැනීම සඳහා දෙවන ඡෙදයේ සඳහන් කුමන කාර්යාලයකින් හෝ ඉල්ලුම් පත්‍රයක් මඟින් පුළුවන.

සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලය,
කොළඹ, 1973, අගෝස්තු 17 වෙනි දින.

වෛද්‍ය. එස්. ජී. කුලතිලක,
කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරී.

උප ලේඛණය—කොළඹ කොට්ඨාශය

| | සේවය | ප්‍රදේශය | ප්‍රමාණය දළ වශයෙන් මසකට පයින්ට් ප්‍රමාණය | අවසන් දිනය |
|---|---|---|---|---|
| 1. | ගම්පහ දුම්රිය පොලේ සිට ගම්පහ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි තැනගේ කායර්‍යාලයේ සිට සෞඛ්‍යවෛද්‍ය නිළධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට ... | ගම්පහ | — 15,840 | 21.09.73 දින පෙ.ව 10 ට |
| 2. | කොච්චිකඩේ සෞඛ්‍ය කායර්‍යාලයේ සිට කොච්චිකඩේ සෞඛ්‍ය කායර්‍යාලය භාර නිළධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථාන වලට ... ... | කොච්චිකඩේ | ... 14,353 | |
| 3. | වල්පිට රජයේ ගොවිපලේ සිට කොච්චිකඩේ සෞඛ්‍ය කායර්‍යාලය භාර නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට ... ... ... | කොච්චිකඩේ | ... 2,066 | |
| 4. | වේයන්ගොඩ දුම්රිය පොලේ සිට කිරිඳිවැල සෞඛ්‍ය කායර්‍යාලයට සහ කිරිඳිවැල සෞඛ්‍ය කායර්‍යාලයේ සිට කිරිඳිවැල සෞඛ්‍ය කායර්‍යාලය භාර නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට ... ... ... ... | කිරිඳිවැල | ... 12,768 | |
| 5. | මීගමු සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කායර්‍යාලයේ සිට මීගමු සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට ... ... | මීගමුව | ... 7,500 | |
| 6. | මීරිගම දුම්රිය පොළේ සිට සෞඛ්‍ය කායර්‍යාලයට සහ මීරිගම සෞඛ්‍ය කායර්‍යාලයේ සිට මීරිගම සෞඛ්‍ය කායර්‍යාලය භාර නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට ... | මීරිගම | ... 7,572 | |
| 7. | හෝමාගම සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි තැනගේ කායර්‍යාලයේ සිට හෝමාගම සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි තැනගේ කොට්ඨාශයේ තිබෙන කිරි මධ්‍යස්ථානවලට ගෙනයාම ... | හෝමාගම | ... 9,200 | |
| 8. | මිණුවන්ගොඩ සෞඛ්‍ය කායර්‍යාලයේ සිට මිණුවන්ගොඩ සෞඛ්‍ය කායර්‍යාලය භාර නිලධාරි තැනගේ කොට්ඨාශයේ පිහිටි කිරි මධ්‍යස්ථානවලට ගෙනයාමට ... ... | මිණුවන්ගොඩ | ... 9,951 | |
| 9. | පාදුක්කේ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි තැන ගේ කායර්‍යාලයේ සිට පාදුක්කේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථාන වලට ... ... | පාදුක්ක | ... 8,160 | |
| 10. | ජාඇල සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි තැනගේ කායර්‍යාලයේ සිට ජාඇල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථාන වලට ... ... | ජාඇල | ... 10,018 | |
| 11. | කැළණියේ සෞඛ්‍ය කායර්‍යාලයේ සිට කැළණියේ සෞඛ්‍ය කාර්යාලය භාර නිලධාරි තැනගේ කොට්ඨාශයේ පිහිටි කිරි මධ්‍යස්ථාන වලට ගෙන යාමට ... ... | කැළණිය | ... 33,387 | |

8.—1248—73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

---

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව—කළුතර කොට්ඨාශය

කිරි නොමැතිව පිසූ ආහාර

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1974 ජනවාරි 1 වනද සිට 1974 දෙසැම්බර් 31 වනද දක්වා (දින දෙකම, ඇතුළත්ව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමු වන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකික යන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කළුතර පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කායර්‍යාලයේ දී සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් හා විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක.. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිළිව සඳහන් කළ යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කායර්‍යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, යාපනය, ගාල්ල, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරීවරුන්ගේ කායර්‍යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක් වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුය. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබා ගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලවා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම් ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දන ගැනීමට මේ සමග ඇති උපලේඛනයේ 5 වැනි තීරුව බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා '' සෞඛ්‍ය සේවා අධිකාරි, කළුතර '' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා ද යි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්‍යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරී ලේකම් තැනට භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණ බවට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

6. **ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්‍යාලයේදී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම.**—ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිල ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කලින් පිළියෙල කරගත් දිනයක මා විසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර්පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ '' බී '' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි ''සී'' උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම් කරන විට ටෙන්ඩරයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳ පොළේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැතිනම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

11. **බඩුබාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩුබාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සළසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසි ද ටෙන්ඩර් කරුවන් විසින් සැළකිය යුතුය.

13. (i) රෝගීයෙකුගේ සම්පූර්ණ ආහාර වේලකට සහල් අවුන්ස 3½ක් ඇතුළත් වන සේ බත්වේල් සැපයීමට ටෙන්ඩර්කරුවන් මිළ ගණන් දක්විය යුතුය.

(ii) දැනට ආහාර උපලේඛනයේ දක්වා ඇති සහල් අවුන්ස 9 ප්‍රමාණය අවුන්ස 7 වශයෙන් වෙනස් කර ඇති නිසා 1972 ඔක්තෝබර් සිට ඒ වෙනුවෙන් අමතරව පාන් සැපයීම අනවශ්‍ය වනු ඇත.

( ii) අවශ්‍ය සහල් ආහාර කොමසාරිස් විසින් සලාක නොවන මිළට සපයන අතර ඒ සඳහා ටෙන්ඩර්කරු ආහාර කොමසාරිස් විසින් විටින් විට නියෝග කරන ලද මිළට ටෙන්ඩර්කරු මුදල් ගෙවිය යුතුය. පරිත්‍යාග කරන ලද සහල් හෝ නොමිලයේ සහල් හෝ පිසීම සඳහා කොන්ත්‍රාත්කරුට සැපයුව හොත් ඒ සඳහා සලාක නොවන සහල් මිළට කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් මුදල් අඩු කරනු ලැබේ. යම්කිසි අවස්ථාවකදී සලාක සහල් සැපයුව හොත් ඒ සහල් සඳහා සලාක මිළට කොන්ත්‍රාත්කරු විසින් මුදල් ගෙවිය යුතුය. ඒ අතර සලාක නොවන සහල් මිළේ සහ සලාක සහල් මිළේ වෙනස කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් අඩු කරනු ලැබේ.

(iv) කූපන් භාර නොදුන හොත් සේවකයන්ට සැපයිය යුත්තේ පාන් ය. කූපන් භාර දුනහොත් ඒ වෙනුවෙන් නොසපයනු ලබන පාන් සඳහා පහත සඳහන් පරිදි කොන්ත්‍රාත්කරුගේ වවුචරයෙන් මුදල් අඩුකරනු ලැබේ :—

(අ) කූපන්වලට ලබාගන්නා සහල් දැනට මෙන් නොමිලයේ වුවහොත් නොසපයනු ලබන පාන්වල සම්පූර්ණ වටිනාකම අඩුකරනු ලැබේ.

(ආ) එවැනි කූපන්වලට සහල් නිකුත් කරන්නේ කොන්ත්‍රාත්කරු ගෙවන සලාක මිළට නම් නොසපයනු ලබන පාන්වල මිළේත් සලාක සහල් මිළේත් වෙනස අඩුකරගනු ලැබේ.

එච්. සී. ඌරගොඩ,
කළුතර සෞඛ්‍ය සේවා අධිකාරී.

1973 අගෝස්තු මස 15 වැනි දින,
කළුතර සෞඛ්‍ය සේවා අධිකාරී කාර්‍යාලයේ දීය.

**උපලේඛනය**

| ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | ඇප මුදල | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය | ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයින්ට: මාළු | මස් | කරවල | බිත්තර | එළවළු | රෝගීන්ට: මාළු | මස් | කරවල | බිත්තර | එළවළු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | | | | | | | | | | | |
| 1. අළුත්ගම ගැමි රෝහල ... | 100... | 400 | | 105... | 105... | 110... | 87... | 324... | 349... | 333... | 347... | 281... | 108 |
| 2. අළුත්ගමවිදිය ගැමි රෝහල | 100... | 400 | | 85... | 83... | 83... | 70... | 265... | 548... | 507... | 518... | 452... | 1,667 |
| 3. ගල්පාත ගැමි රෝහල ... | 100... | 600 | | 206... | 206... | 207... | 223... | 638... | 313... | 311... | 329... | 307... | 994 |
| 4. ගෝනදූව ගැමිරෝහල ... | 100... | 600 | | 294... | 331... | 317... | 236... | 989... | 449... | 514... | 478... | 389... | 1,551 |
| 5. බණ්ඩාරගම මාතෘ නිවාසය | 100... | 400 | 1973 සැප්තැම්බර් මස 28 දින පෙ.ව. 10.00ට | 80... | 84... | 83... | 24... | 297... | 47... | 36... | 46... | 13... | 164 |
| 6. බේරුවල මාතෘ නිවාසය ... | 100... | 400 | | 127... | 116... | 122... | 119... | 387... | 47... | 43... | 52... | 32... | 139 |
| 7. බුලත්සිංහල මාතෘ නිවාසය | 100... | 300 | | 129... | 141... | 134... | 136... | 424... | 293... | 317... | 353... | 249... | 951 |
| 8. වාද්දුව මාතෘ නිවාසය ... | 100... | 300 | | 77... | 78... | 78... | 78... | 314... | 31... | 21... | 30... | 28... | 98 |
| 9. දොඩම්ගොඩ ගැමි රෝහල... | 100... | 400 | | 129... | 128... | 129... | 124... | 408... | 413... | 397... | 409... | 380... | 1,295 |
| 10. මතුගම ගැමි රෝහල ... | 100... | 800 | | 214... | 138... | 134... | 219... | 455... | 993... | 900... | 867... | 900... | 3,242 |
| 11. ඉත්තැපාන රෝහල ... | 100... | 600 | | 167... | 165... | 174... | 169... | 510... | 876... | 931... | 955... | 941... | 2,823 |
| 12. නෑබඩ රෝහල ... | 100 | 1,000 | | 520... | 520... | 499... | 503... | 1,552... | 2,009... | 1,897... | 1,967... | 1,710... | 6,164 |
| 13. මීගහතැන්න රෝහල ... | 100... | 600 | | 129... | 127... | 126... | 129... | 402... | 1,867... | 1,832... | 1,784... | 1,781... | 5,940 |

8–1118—73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ජාතික කිරි ව්‍යාපාරය—පිරිසිදු එළකිරි එහා මෙහා ගෙනයාම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසු කම් ඇති පුද්ගලයින් සහ සේවා.**—වර්ෂ 1974 ජනවාරි මස 1 දින සිට 1974 දෙසැම්බර් 31 දක්වා (දෙදින ඇතුළුව) කාලය තුල මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තිරයෙහි සඳහන් වන ආයතනයන්ට, සෞඛ්‍ය කාර්යාලවල සිට කිරි මධ්‍යස්ථානවලට, පිරිසිදු එළකිරි ගෙනයාම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම් විසින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර කළුතර සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයෙහි II ඡෙදයෙහි සඳහන් පරිදි, රු. 100 ක තැන්පත් මුදලක් මා නමට කච්චේරියේ තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, කොළඹ, මඩකලපුව, ගාල්ල, යාපනය, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වව්නියාව යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි, පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—මෙම දෙපාර්තමේන්තුවේ දැනට කොන්ත්‍රාත්තුවක් නොදරණ අය ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුය. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු එළකිරි ප්‍රමාණයන් දළ වශයෙන් දැනගැනීමට මේ සමග ඇති උපලේඛනයෙහි 3 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරි, කළුතර'' කියා එවිය යුතුයි. සීල්කරන ලද ටෙන්ඩර්පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාද යන්න පැහැදිළිව සඳහන් කළ යුතුවාක් මෙන් ම එහි වම් පස පහළ කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිළිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරි මහතාට දීමෙන් එය ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැකිය.

6. **ටෙන්ඩර්පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර්පත් භාර ගැනීම අවසාන වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර් කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයේ සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරණ ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත්වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේනම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාළය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු නියමිත ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාත් හැර පිළිපැදිය යුතුද වන්නේය.

11. **වෙනත් විස්තර.**—තවදුරටත් විස්තර දැනගැනීම සඳහා දෙවන ඡෙදයේ සඳහන් කුමන කාර්යාලයකින් හෝ ඉල්ලුම් පත්‍රයක් මගින් පුළුවන.

එච්. සී. ඌරගොඩ,
කළුතර සෞඛ්‍ය සේවා අධිකාරී.

සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලය,
කළුතර,
1973 අගෝස්තු මස 17 වැනි දින.

### උපලේඛනය

| | (1) සේවය | (2) ප්‍රදේශය | (3) යැවිය හැකි ප්‍රමාණය මස කට පයින්ට් | (4) අවසාන දිනය සහ වේලාව |
|---|---|---|---|---|
| 1. | පානදුර, පානදුර සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි තැන ගේ කාර්යාලයේ සිට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කොට්ඨාශයේ පිහිටි මධ්‍යස්ථානවලට ගෙනයාමට | පානදුර | ... 8,400 | 1973 සැතැම්පබර් 28 වෙනිද පෙරවරු 10 ට |
| 2. | කළුතර, කළුතර ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කාර්යාලයේ සිට ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කොට්ඨාශයේ පිහිටි මධ්‍යස්ථානවලට ගෙනයාමට | කළුතර | ... 8,675 | |
| 3. | හොරණ, හොරණ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කාර්යාලයේ සිට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කොට්ඨාශයේ පිහිටි මධ්‍යස්ථානවලට ගෙනයාමට | හොරණ | ... 7,387 | |

8–1131—73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

කොළඹ 5, නාරාහේන්පිට නාවලපාරේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැඩපල හා යන්ත්‍රාගාරයේ කෘෂිකර්ම ඉංජිනේරු තැන විසින් පහත සඳහන් ද්‍රව්‍ය කොළඹ 5, නාරාහේන්පිට වැඩපල හා යාන්ත්‍රාගාරයට ගෙනවිත් භාරදීම සඳහා 1973 සැප්තැම්බර් මස 14 වැනි දින සවස 3 දක්වා ටෙන්ඩර් පත් භාර ගනු ලබේ.

**විෂ්කම්භය 6" ආම්ර්ඩ් හෝස් පයිප්ප අඩි 60 ක් සැපයීම**

2. ටෙන්ඩර් පත් මුද්‍රා තැබූ කවරවල එවිය යුතු අතර, කවරයේ උඩ වම් කෙළවරේ "ආම්ඩ්ඩ් හෝස් පයිප්ප" යන්න සඳහන් කර නියමිත වේලාවට පෙර කොළඹ 5, නාරාහේන්පිට, නාවලපාරේ පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැඩපල හා යාන්ත්‍රාගාරයේ කෘෂිකර්ම ඉංජිනේරු (සැපයීම්) වෙත එවිය යුතුය.

3. ප්‍රශ්න කිරීමකින් තොරව ටෙන්ඩර්පත් පිළිගැනීමේ හෝ කොටසක් පිළිගැනීම හෝ පිළි නොගැනීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත ඇත.

4. ටෙන්ඩර් පත් දෙපිටකින් යුතුව එවිය යුතුය.

ජේ. කේ. පී. ප්‍රනාන්දු,
කෘෂිකර්ම ඉංජිනේරු (නිෂ්පාදන).

වැඩපල හා යන්ත්‍රාගාරය,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1728,
කොළඹ 5.
1973. 08. 20

8-1236 —73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා නාවික හමුදාව

ශ්‍රී ලංකා නාවික හමුදාවේ පහත සඳහන් කාර්යය සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් ඒ ඉදිරියෙන් දක්වා ඇති දිනයන්හි පෙරවරු 10.00 වනතුරු කොළඹ 1, තැ. පෙ. 593, ශ්‍රී ලංකා නාවික හමුදාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ :—

| කර්යය | ටෙන්ඩර් භාරගනු ලබන අවසාන දිනය | අවශ්‍ය මූල්‍ය වත්කම |
|---|---|---|
| කොළඹ 13, කොච්චිකඩේ ශ්‍රී ලං. රංගල ආයතනයේ නැවියන් සඳහා නිවාස ගොඩනැගිල්ල ඉදිකිරීම සම්පූර්ණ කිරීම | 1973.09.20 | රු. 250,000 |

2. කොළඹ 1, ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානයේ ප්‍රධාන ඉංජිනේරු නිලධාරීගේ කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල, දෙපිටපතකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. මෙම මූලස්ථානයේ මුදල් හා සිවිල් පාලන අධ්‍යක්ෂ වෙත, මෙම කාර්යය සඳහා රු. 100.00 ක මුදලක් තැන්පත් කර ලබාගත් ලදුපත ඉදිරිපත් කිරීමෙන්, අංක. 17 දරණ ප්‍රධාන ඉංජිනේරු නිලධාරිගේ කාර්යාලයෙන් 1973 සැප්තැම්බර් මස 13 දින දහවල් 12 වනතුරු ටෙන්ඩර් පත් ලබාගත හැක. ටෙන්ඩර් ගාස්තු වශයෙන් ආපසු නොගෙවනු ලබන රු. 5.00 ක මුදලක් ගෙවිය යුතුය. චෙක්පත්, මුදල් ඇණවුම් හෝ තැපැල් ඇණවුම් භාරගනු නොලැබේ.

3. ඉහතින් සඳහන් කර ඇති මූල්‍ය වත්කම් ප්‍රමාණය සඳහා රජයේ කොන්ත්‍රාත්තු භාර ගන්නා ලද බවට විධිමත් ලිඛිත සාධක ඉදිරිපත් කළ හැකි අයැදුම් කරුවන් පමණක් ටෙන්ඩරය ඉල්ලීම සඳහා සුදුස්සෝ වෙත්.

4. ටෙන්ඩරය ලියාපදිංචි තැපෑලෙන් එවිය හැකිවන අතර, නොඑසේ නම් මූලස්ථානයේ අංක. 14 දරණ කාමරයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය හැකිවේ. කවරයේ වම් උඩ කෙළවරේ "රංගල නැවියන්ගේ නිවාස ඉදිකිරීම සම්පූර්ණ කිරීම" යනුවෙන් සඳහන් කරන්න. ඉහත පළමුවැනි ඡේදයේ සඳහන් පරිදි ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිට ලැබෙන සේ මෙම ටෙන්ඩර් පත් එවිය යුතුය. මෙම දිනය සහ වේලාව පසුවී ලැබෙන ටෙන්ඩර් පත් භාරගනු නොලැබේ.

5. ටෙන්ඩරය විවෘත කිරීමෙන් පසු සති 8 ක කාලයක් සඳහා ටෙන්ඩර් කරුවන් විසින් තම ටෙන්ඩරය විවෘතව තැබිය යුතුය.

6. කුමන හෝ ටෙන්ඩර් පත් ප්‍රශ්න කිරීමකින් තොරව නිශ්ප්‍රභා කිරීමේ අයිතියත්, ටෙන්ඩරයක කුමණ හෝ කොටසක් භාරගැනීමේ අයිතියත් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති සතුවේ. මෙම ටෙන්ඩරය සමග ප්‍රසිද්ධ කර ඇති උපදෙස් සහ ටෙන්ඩර් අකාති පත්‍ර සමග නිකුත් කරනු ලබන ටෙන්ඩර් පිළිබඳ පොදු රෙගුලාසි තරයේ පිළිපැද නැති ටෙන්ඩර් පත් භාරගනු නොලැබේ.

7. කුමන හෝ සියළුම ටෙන්ඩර්කරුවකු ටෙන්ඩරයේ අවසාන දිනට පෙර, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත නොදන්වා, ටෙන්ඩර් ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කළහොත් හෝ අසමත් වුවහොත් හෝ එම ටෙන්ඩර් තැන්පතු මුදල රාජසන්තක කරනු ලැබේ.

8. පිළිගත් ටෙන්ඩර්කරුවකු විසින් යථෝක්ත කොන්ත්‍රාත්තුවේ සඳහන් කාර්යයන් සඳහා ලාංකික කම්කරුවන් පමණක් සේවයේ යෙදවිය යුතු අතර, හැකි සෑම අවස්ථාවකදීම එම කාර්යයන් කැරෙන ප්‍රදේශයෙන්ම සේවකයින් බඳවා ගත යුතුය.

9. ඉහත සඳහන් දිනයේදී සහ වේලාවේදී ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර් කරුවනට හෝ ඔවුනගේ නියෝජිතයිනට හෝ පැමිණ සිටීමට ඉඩ දෙනු ලැබේ.

10. මෙම මූලස්ථානයේ අංක 17 දරණ කාමරයේ දී සැලසුම් පරීක්ෂා කළ හැක. භූමිය සහ සැලැස්ම පරීක්ෂාකර බැලීම සඳහා කොළඹ, නාවික හමුදා මූලස්ථානයේ, ප්‍රධාන ඉංජිනේරු නිලධාරි සමග විධිවිධාන සලසාගත හැක.

11. තවදුරටත් අවශ්‍ය විස්තර ලබාගැනීම සඳහා ප්‍රධාන ඉංජිනේරු නිලධාරිට **අයැදුම් කළ යුතුය.**

එච්. ජේ. එස්. බෝල්ඩිසිං,
කොමාන්ඩර් (ඉ), ශ්‍රී.ලං.නා.හ.,
නාවික හමුදාපති වෙනුවට.

1973 අගෝස්තු මස 20 දින,
කොළඹ 1,
තැ. පෙ. 593 දරණ ස්ථානයේ
ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානයේදී.

8-1255—73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

---

## මැතිවරණ දෙපාර්තමේන්තුව

### පරණ අනුපිටපත් යන්ත්‍ර, යතුරු ලියන, ටයර්, ටියුබ් සහ වෙනත් ද්‍රව්‍යය

පහත සඳහන් සේවයට ගත නොහැකි ද්‍රව්‍යයන් විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 7, මැතිවරණ දෙපාර්තමේන්තුවේ, මැතිවරණ කොමසාරිස් වරයා විසින් 1973 ඔක්තෝබර් 01 වැනි දින පෙරවරු 11.45 තෙක් භාරගනු ලැබේ. 1973 ඔක්තෝබර් 01 වැනි දින පෙරවරු 11.45 ට ටෙන්ඩර් විවෘත කරන වේලාවට කැමැති ඕනෑම ටෙන්ඩර් කරුවෙකුට පැමිණ සිටිය හැක.

| | ද්‍රව්‍යය | ප්‍රමාණය |
|---|---|---|
| 1. | ගෙස්ටෙට්නර් අනුපිටපත් යන්ත්‍ර ... | ... 8 |
| 2. | "අන්ඩර්වුඩ" එකතු කිරීමේ යන්ත්‍ර | ... 1 |
| 3. | ඉංග්‍රීසි යතුරු ලියන—"හර්මිස්" ... | ... 3 |
| 4. | ඉංග්‍රීසි යතුරු ලියන—"රෙමින්ටන්" | ... 1 |
| 5. | ඉංග්‍රීසි යතුරු ලියන—"අන්ඩර්වුඩ්" | ... 4 |
| 6. | ඉංග්‍රීසි යතුරු ලියන—"ඉම්පීරියල්" | ... 2 |
| 7. | ඉංග්‍රීසි යතුරු ලියන—"රෝයල්" | ... 1 |
| 8. | දෙමල යතුරු ලියන—"වුඩ්ස්ටොක්" | ... 1 |
| 9. | සිංහල යතුරු ලියන—"ඔලිම්පියා" | ... 1 |
| 10. | පාපැදි ... ... | ... 4 |
| 11. | "ඉලෙක්ට්‍රික්" ශීතකරණ ... | ... 1 |
| 12. | හකුලන කැන්වස් බූරු ඇඳන් ... | ... 1 |
| 13. | වැසිකිලි අසුන් ... ... | ... 2 |
| 14. | විදුලි පන්දම් ... ... | ... 23 |
| 15. | පිරිමි කුඩ ... ... | ... 2 |
| 16. | මේස පිහියා ... ... | ... 1 |
| 17. | සිදුරු 2 ජීද්‍රකරණ ... | ... 1 |
| 18. | පරණ ටයර් ... ... | ... 30 |
| 19. | පරණ ටියුබ්—ජීප් ප්‍රමාණයන් ... | ... 27 |
| 20. | පරණ ජීප් හුඩ් රෙදි ... | ... 1 |
| 21. | පරණ ජීප් ක්ලච් ප්ලේට්ස් ... | ... 9 |
| 22. | පරණ ජීප් රිංග් ගියර්ස් ... | ... 4 |
| 23. | පරණ ජීප් යුනිවර්සල් ජොයින්ට්ස් ... | ... 4 |
| 24. | ස්ටාටර් මෝටර් ස්විච් ... | ... 1 |
| 25. | වීල් සිලින්ඩර් (fපර්ජෝ කාර්) ... | ... 1 |
| 26. | ටයි රොඩ්ස් ... ... | ... 2 |
| 27. | ඉලෙක්ට්‍රික් හෝර්න්ස් සෙට් ... | ... 2 |
| 28. | පරණ රේඩියේටර් ... ... | ... 1 |
| 29. | ග්‍රීස් වීල් කැප්ස් (ජීප්) ... | ... 2 |
| 30. | සිංක්‍රොමේෂ් ... ... | ... 1 |
| 31. | ෂොක් ඇබ්සෝබර්ස් ... | ... 9 |
| 32. | ආමේචර්ස් ... ... | ... 2 |
| 33. | පරණ බැටරි ... ... | ... 3 |
| 34. | ඉංජින් හෙඩ් (විලිස් ජීප්) ... | ... 1 |
| 35. | පරණ පත්තර රාත්තල් ... | ... 110 |
| 36. | අනුපිටපත් තීන්ත ටියුබ් ආවරණයන් (ඊයම්) | ... 315 |
| 37. | ස්පීඩෝමීටර් ඔරලෝසු ... | ... 1 |

2. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා ආකෘතීන් මෙම කාර්යාලයට පැමිණ ලබා ගත හැක. නැතහොත්, පහත දැක්වෙන ආකෘතිය අනුව ඔවුන්ගේම ටෙන්ඩර් සකස්කර එවිය හැක.

3. මැතිවරණ කොමසාරිස් වරයා නමින් නිකුත් කරන ලද රු. 25 මුදල් ඇනවුම් පතක් එක් එක් ටෙන්ඩර් ආකෘතියෙහි අමුනා එවිය යුතුවේ.

4. ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්ත විය යුතුවන අතර, ඒවා කවරයක බහා අලවා මුද්‍රා තබා, එසේ මුද්‍රා තබන ලද කවරය තවත් කවයරක් තුළ බහා එයද අලවා මුද්‍රා තබා, මැතිවරණ කොමසාරිස්, තැ.පෙ. 814, කොළඹ 7, යනුවෙන් ලිපිනය කළ යුතු වේ. වම්පස ඉහළ කෙලවරේ "පරණ අනුපිටපත් යන්ත්‍ර, යතුරු ලියන, ටයර්, ටියුබ් සහ වෙනත් ද්‍රව්‍ය මිලයට ගැනීම සඳහා ටෙන්ඩරය" යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් ආකෘතියේ යම්කිසි වෙනස් කිරීමක් හෝ මැකීමක් කර තිබේ නම් ඊට ටෙන්ඩර් කරු කෙටි අත්සන යෙදිය යුතුවේ.

5. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපැලෙන් එවීම හෝ පහත අත්සන් කරන අයගේ කාර්යාලයේ ඒ සඳහා තබා ඇති පෙට්ටියේ තැන්පත් කිරීම හෝ කළ හැක. ද්‍රව්‍යයන් පරීක්ෂා කර බැලීමට කැමැති ටෙන්ඩර් ඉල්ලුම් කරුවන්ට ඒවා සාමාන්‍ය වැඩ කරන දිනවල පෙරවරු 8.30 ටත්

පෙරවරු 11.30 ටත් අතර සහ පස්වරු 1.00 ටත් පස්වරු 3.00 ටත් අතරද, සෙනසුරාදා දිනයන්හි පෙරවරු 8.30 ටත් පෙරවරු 11.00 ටත් අතර හෝ පරික්ෂා කර බැලිය හැක.

6. ටෙන්ඩරය පිළිගැනීමේ දී ප්‍රධාන නිර්නායකය වන්නේ රජයට ලැබෙන උපරිම ගණනය. එමනිසා, කිසිම ප්‍රශ්නයක් නොමැතිව, යම්කිසි ටෙන්ඩරයක් පිළිගැනීමට හෝ යම් ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය සහ ටෙන්ඩරයක යම් කොටසක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දෙපාර්තමේන්තුව සතුවේ.

7. ටෙන්ඩරය භාරගත් බව දන්වා එවන ලද ලියමන ලැබී දින (5) පහක් ඇතුලත ටෙන්ඩර්කරුට එම ද්‍රව්‍යයන් ඉවත් කර ගත නොහැකි වූයේ නම් හෝ ඉවත් කර ගැනීම පැහැර හැරියේ නම්, ඔහු විසින් තැන්පත් කර ඇති මුදල රාජසන්තක කෙරෙන අතර, ඔහුගේ නම, වගකීම් පැහැර හරින කොන්ත්‍රාත්කරුවන්ගේ නම් ලැයිස්තුවට එකතු කරනු ලැබේ. ටෙන්ඩර් පත පිලිගත් බව දන්වා යැවෙන ලිපිය, ටෙන්ඩර්කරු විසින් දෙන ලද ලිපිනයට යවන ලද්දේ නම් හෝ එම ලිපිනයේ තබා එන ලද්දේ නම්, ටෙන්ඩර්කරුගේ ටෙන්ඩරය පිළිගත් බව දැන්වීමට ප්‍රමාණවත්වූ තොරතුරු වශයෙන් සලකනු ලැබේ. ටෙන්ඩරය වෙනුවෙන් තබන ලද ඇප මුදල ආපසු ගෙවනු ලබන්නේ ඒ පිළිබඳවූ සියලුම ක්‍රියාවන් අවසන්වී ද්‍රව්‍යයන් විකිණීම නිමකළාට පසුව පමනකි.

8. ඉහත සඳහන් නියමයන්ට අනුකූල නොවූ ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්.

මැතිවරණ කොමසාරිස් කාර්යාලයය,
තැ. පෙ. අංක 814,
33, හෝර්ටන් පෙදෙස,
කොළඹ 7, 1973 අගෝස්තු 20 දින,

**ආකෘතිය**

**(පිටපත් දෙකකින් යුක්තව එවිය යුතුය)**

**කොළඹ 7, මැතිවරණ දෙපාර්තමේන්තුවේ පරණ අනුපිටපත් යන්ත්‍ර, පරණ යතුරු ලියන, ටයර්, ටියුබ් සහ වෙනත් පාවිච්චියට ගත නොහැකි ද්‍රව්‍යයන් මිලයට ගැනීම සඳහා ටෙන්ඩරය**

| ද්‍රව්‍යය | ප්‍රමාණය | මිලදී ගැනීමට කැමති මිල ගණන් රු. ශ. (ඉලක්කම් වලින්) | මිලදී ගැනීමට කැමති මිල ගණන් රු. ශ. (අකුරෙන්) |
|---|---|---|---|
| 1. ගෙස්වෙට්නර් අනුපිටපත් යන්ත්‍ර ... | 8 | | |
| (1) 66ඊ/305124 ... | ... | ... .............. | .............. |
| (2) 66ඊ/306289 ... | ... | ... .............. | .............. |
| (3) 260—573781 ... | ... | ... .............. | .............. |
| (4) 130ඊ.493387 ... | ... | ... .............. | .............. |
| (5) 130ඊ.470600 ... | ... | ... .............. | .............. |
| (6) 160ඊ.499552 ... | ... | ... .............. | .............. |
| (7) 260—581460 ... | ... | ... .............. | .............. |
| (8) 260—ඊ. 647253 | ... | .............. | .............. |
| 2. ''අන්ඩර්වුඩ්'' එකතු කිරීමේ යන්ත්‍ර | 1 | | |
| අංක 530089/8120 ... | ... | ... .............. | .............. |
| 3. ''හර්මීස්'' ඉංග්‍රීසි යතුරු ලියන ... | 3 | | |
| (1) අංක 8050890—12″ | ... | ... .............. | .............. |
| (2) අංක 8050791—12″ | ... | ... .............. | .............. |
| (3) අංක 8050170—18″ | ... | ... .............. | .............. |
| 4. ''රෙමින්ටන්'' ඉංග්‍රීසි යතුරු ලියන | 1 | | |
| අංක එස්ජේ. 339174—12″ | ... | ... .............. | .............. |
| 5. ''අන්ඩර්වුඩ්'' ඉංග්‍රීසි යතුරු ලියන | 4 | | |
| (1) අංක 11—6464669—12″ | ... | .............. | .............. |
| (2) අංක 11—6224006—12″ | ... | ... .............. | .............. |
| (3) අංක 11—6465301—12″ | ... | ... .............. | .............. |
| (4) අංක 11—6426123—12″ | ... | ... .............. | .............. |
| 6. ''ඉම්පිරියල්'' ඉංග්‍රීසි යතුරු ලියන | 2 | | |
| (1) අංක ඉසෙඩ්. 165397—12″ | ... | ... .............. | .............. |
| (2) අංක 290890—15″ | ... | ... .............. | .............. |
| 7. ''රෝයල්'' ඉංග්‍රීසි යතුරු ලියන ... | 1 | | |
| අංක එම්ජී. 15 ආර්. 4334169—15″ ... | | ... .............. | .............. |
| 8. ''වුඩ්ස්ටොක්'' දෙමල යතුරු ලියන | 1 | | |
| අංකය ඇන්. 518240—12″ | ... | ... .............. | .............. |
| 9. ''ඔලිම්පියා'' සිංහල යතුරු ලියන | 1 | | |
| අංකය 7—27763 / 7—355459) 15″ | ... | ... .............. | .............. |
| 10. පාපැදි ... | ... 4 | | |
| (1) අංක එච්.සී. 02785—රෝඩ්මාස්ටර් | | .............. | .............. |
| (2) අංක ජී.වී. 51437—රැලේ | ... | ... .............. | .............. |
| (3) අංක බීබී. 17311—රැලේ | ... | ... .............. | .............. |
| (4) අංක ජී.ටී. 55886—රැලේ | ... | ... .............. | .............. |
| 11. ''ඉලෙක්ට්‍රික්'' ශීතකරණය—ඝනඅඩි 4 ... | ... 1 | ... .............. | .............. |
| 12. හකුලන කැන්වස් බූරු ඇඳන් | ... 1 | .............. | .............. |
| 13. වැසිකිලි අසුන් ... | ... 2 | ... .............. | .............. |
| 14. විදුලි පන්දම් | ... 23 | ... .............. | .............. |
| 15. පිරිමි කුඩ ... | ... 2 | ... .............. | .............. |
| 16. මේස පිහියා ... | ... 1 | ... .............. | .............. |
| 17. සිදුරු 2 පීද්‍රකරණ | ... 1 | ... .............. | .............. |
| 18. පරණ ටයර් ... | ... 30 | | |
| ප්‍රමාණය : 700 × 15—12 | ... | ... .............. | .............. |
| 380 × 165—8 | ... | ... .............. | .............. |
| 750 × 16—4 | ... | ... .............. | .............. |
| 600 × 16—4 | ... | ... .............. | .............. |
| 710 × 15—2 | ... | ... .............. | .............. |
| 19. පරණ ටියුබ්—ජීප් ප්‍රමාණයන් | ... 27 | ... .............. | .............. |
| 20. පරණ ජීප් හුඩ් රෙදි | ... 1 | ... .............. | .............. |
| 21. පරණ ජීප් ක්ලච් ප්ලේට්ස් | ... 9 | ... .............. | .............. |
| 22. පරණ ජීප් රිංග් ගියර්ස් | ... 4 | ... .............. | .............. |
| 23. පරණ ජීප් යුනිවර්සල් ජොයින්ට්ස් | 4 | ... .............. | .............. |
| 24. ස්ටාටර් මෝටර් ස්විච් | ... 1 | ... .............. | .............. |
| 25. වීල් සිලින්ඩර් (fපර්ජෝ කාර්) | ... 1 | ... .............. | .............. |
| 26. ටයි රොඩ්ස් ... | ... 2 | ... .............. | .............. |
| 27. ඉලෙක්ට්‍රික් හෝර්න්ස් සෙට් | ... 2 | ... .............. | .............. |
| 28. පරණ රේඩියේටර් | ... 1 | ... .............. | .............. |
| 29. ග්‍රීස් වීල් කැප්ස් (ජීප්ස්) | ... 2 | ... .............. | .............. |
| 30. සිංක්‍රොමෙෂ් ... | ... 1 | ... .............. | .............. |
| 31. ෂොක් ඇබ්සෝබර් | ... 9 | ... .............. | .............. |
| 32. ආමේචර්ස් ... | ... 2 | ... .............. | .............. |
| 33. පරණ බැටරි ... | ... 3 | ... .............. | .............. |
| 34. ඉන්ජින් හෙඩ් (විලිස් ජීප්) | ... 1 | ... .............. | .............. |
| 35. පරණ පත්තර රාත්තල් | ...110 | ... .............. | .............. |
| 36. අනුපිටපත් තීන්ත ටියුබ් ආවරණයන් (ඊයම්) | ...315 | ... .............. | .............. |
| 37. ස්පීඩෝමීටර් ඔර්ලෝසු | ... 1 | ... .............. | .............. |

මෙහි පහත අත්සන් කරන.................................................................
(ලිපිනය)

........................................ පදිංචි ........................................
(නම)

........................................වන මම යථෝක්ත භාණ්ඩ මිලයට ගැනීම සඳහා ඉහත සඳහන් ටෙන්ඩරය ඉදිරිපත් කරමි.

........................................
ටෙන්ඩර් ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය : ........................................

ටෙන්ඩර් ඉලලුම්කරුගේ නම සහ ලිපිනය :—

..................................................
..................................................
..................................................

8-1217—73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

### පුත්තලම් දිස්ත්‍රික්කයේ තැනීම් වැඩ

පුත්තලම දිස්ත්‍රික්කයේ පහත සඳහන් තැනීම් වැඩ සඳහා 73.09.17 දින දවල් 12 දක්වා කොළඹ, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ. ටෙන්ඩර් තැන්පත් කරන පෙට්ටිය කොළඹ, ගාලු මුවදෙර, මහ ලේකම් කාර්යාලයේ තුන්වැනි මහලේ පිහිටි ඉඩම් කොමසාරිස් කාර්යාලයයේ අංක 320 දරන කාමරයේ තබනු ඇත.

| වැඩයේ ස්වභාවය | ප්‍රා. ආ. නි. කොට්ඨාශය | ලියාපදිංචි විය යුතු මුදල රු. |
|---|---|---|
| නරියාගම පංසල පාරේ දෙවන සැතපුම | හලාවත | 25,000 |

2. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමුපකාර සමිතිවලට ද, රජයේ දෙපාර්තමේන්තුවල ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් දක්වා ඇති ප්‍රමාණයන්ට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ටද 73.09.14 දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝර්ම අපේක්ෂකයින් පුත්තලම කච්චේරියෙන් හෝ දිවයිනේ ඕනෑම කච්චේරියක හෝ කොළඹ මහාභාණ්ඩාගාරයට හෝ ඉහත සඳහන් ඇති වැඩවලට, එක් එක් වැඩය වෙනුවෙන් රු. 50 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් හා ඒ වැඩවලට ඉදිරියෙන් දක්වා ඇති මුදලට හෝ ඊට වැඩියෙන් මුදලකට ලියාපදිංචි වී ඇති බවට සාධකයක් පුත්තලම දිසාපති වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. අනුමත කරන ලද සමිති ටෙන්ඩර් තැන්පත් මුදලින් නිදහස්ය. එහෙත් ඉහත සඳහන් මුදල් ප්‍රමාණයන්ට ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසුව පමණක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ පුත්තලම දිසාපති වෙතින් ලබාගත යුතු වන ආකෘති පත්‍ර මගින් පිටපත් දෙකකින් යුක්තවයි. ටෙන්ඩර් බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "......... සඳහා ටෙන්ඩර් පත්‍රය" යි සඳහන් කළ යුතුය. සියළුම ටෙන්ඩර් අත්සන් තබා සීල් කර සුරක්ෂිතව ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර ලේඛනගත තැපෑලෙන් නොඑවන්නේ නම්, කොළඹ, ගාලු මුවදෙර පිහිටි මහාලේකම් කාර්යාලයයේ තුන්වැනි මහලේ පිහිටි ඉඩම් කොමසාරිස් කාර්යාලයේ අංක 320 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ පැමිණ බහාලිය යුතුය.

5. 73.09.17 දින ප. ව. 1.30 ට ඉහතකී අංක 320 දරණ කාමරයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන අතර එම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන අවසථාවේ ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට පැමිණ සිටිය හැක.

6. කිසිදු හේතුවක් නොදක්වා සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමට හෝ ඕනෑම ටෙන්ඩරයක් හෝ ටෙන්ඩරයක කොටසක් පිළිගැනීම හෝ ටෙන්ඩර් මණ්ඩලය සතුය.

7. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් පිළිගත් ටෙන්ඩරයේ මුලු මුදලින් සියයට පහක මුදලක් ඇප වශයෙන් තැන්පත් කළ යුතුය. එසේම ටෙන්ඩර්කරුට ටෙන්ඩරය පිළිගත් බව දැනුම් දීමෙන් දින 7 (හත) ක් ඇතුළතදී වැඩ ගිවිසුමකට අත්සන් කිරීමට ඔහු සූදානම්ව සිටිය යුතුය. ටෙන්ඩර් භාරගත් බව සඳහන් ලියවිලි ඔහුට පුද්ගලිකව භාර දීමෙන් හෝ ඔහු විසින් දී ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යැවීමෙන් ඔහුට ඒ බැව් දැන්වූ බව පිළිගැනෙනවා ඇත. එසේ දැනුම් දීමෙන් පසු ගිවිසුම් පත්‍රයට අත්සන් තැබීම අත පසු කළහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත් ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වනවා ඇත. අසාර්ථක ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැනපත් මුදල ආපසු ගෙවීමට කටයුතු කරන්නේ පිළිගත් ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් කරන ලද මුදලින් සියයට පහක තැන්පත් ඇප මුදලක් වශයෙන් තැන්පත් කළ පසුවයි.

8. මෙම කොන්ත්‍රාත්තුව කරවා ගැනීමට ලාංකික කම්කරුවන් පමණක් යොදවා ගැනීමට කොන්ත්‍රාත්කරු එකඟවිය යුතු අතර එවැනි කම්කරුවන් හැකිතාක් බඳවා ගත යුත්තේ වැඩය කරන ප්‍රදේශය තුළිනි. කම්කරුවන්ට වේතනය ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන හා මින් ඉදිරියට ක්‍රියාත්මක විය හැකි සියලුම රෙගුලාසි වලට අනුකූලව වේතනයන් ගෙවීමට කොන්ත්‍රාත්කරු එකඟවිය යුතුය.

9. වැඩි විස්තර පුත්තලම දිසාපතිවෙතින් ලබා ගත හැක.

ඛ. සූ. විජේවීර,
පුත්තලම දිසාපති.

1973.08.15 දින.

8-1152 —73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

---

### පුත්තලම් දිස්ත්‍රික්කයේ තැනීම් වැඩ සඳහා ටෙන්ඩර් කැඳවීම

1973.07.13 දින අංක 68 දරණ ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද පුත්තලම් දිස්ත්‍රික්කයේ තැනීම වැඩ යටතේ වූ 7–252/1 දරණ ගැසට් දැන්වීමේ ඇතුළත්ව තිබූ පහත දක්වෙනා කොන්ත්‍රාත් වැඩ සඳහා වූ ටෙන්ඩර් කැඳවීම අවලංගු කරණ ලද බව මෙයින් දන්වමි. වැඩි විස්තර සඳහා 1973.08.31 දින ගැසට් පත්‍රය බලන්න.

| වැඩෙහි ස්වභාවය | ප්‍රා. ආ. නි. කොට්ඨාශය | ලියාපදිංචි විය යුතු මුදල රු. |
|---|---|---|
| නරියාගම පන්සල පාරේ දෙවන කොටස. | හලාවත | 18,000 |
| මහකෝන් වැව ව්‍යාපාර පාර | නිකවැරටිය | 18,000 |

දිසාපති කාර්යාලය,
පුත්තලම.

ඛ. සූ. විජේවීර,
පුත්තලම දිසාපති.

8-1151—73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

---

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් කොළඹ කොටුවේ ලක්සලට සංගීත භාණ්ඩ සැපයීම, සවිකිරීම හා නඩත්තු කිරීම සඳහා ටෙන්ඩර් 1973. 09. 25 දින පෙ. ව. 10 වන තෙක් භාර ගනු ලැබේ.

2. වැඩි විස්තර හා ටෙන්ඩර් කොන්දේසි කුඩා කර්මාන්ත අධ්‍යක්ෂතැනගෙන් ලබාගත හැක.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමු අංකය :—3/1—(5/58)
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1.
1973 අගෝස්තු මස 21 වැනි දින.

8-1142 —73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

---

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

හඟුරන්කෙත බලවේග ආයතනය අළුත්වැඩියා කිරීම සඳහා කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ල, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1973. 09. 20 දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. යම්කිසි රජයේ දෙපාර්තමේන්තුවක රු. 10,000 කට හෝ එයට වැඩි මුදලකට හෝ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන්ට මෙයට සහභාගී විය හැකිය.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගිවීමට කැමති කොන්ත්‍රාත්කරුවන් විසින් රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ තැන්පත් කොට 1973. 09. 19 දින පෙ. ව. 12 ට පෙර කුවිතාන්සි හා ලියාපදිංචිය ඉදිරිපත් කර ටෙන්ඩර් පත් ලබා ගත යුතුවේ.

සෝමපාල ගුණධීර.
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමුව :—3/1—(1/60)
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1, 1973 අගෝස්තු මස 21 දින.

8-1143 —73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

### ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

දුම්රිය දෙපාර්තමේන්තුව (ස්ටෝර්ස් එක්ස්පෙන්ඩිචර්ස්) ගිනි නිවන උපකරණයන් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 10, දුම්රිය මූලස්ථාන, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති, විසින් 1973 ඔක්තෝබර් මස 3 වෙනි බදාදා පෙරවරු 11.00 තෙක් බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමට පළමු ටෙන්ඩර් කරුවන් විසින් ඉහත සඳහන් සේවා භාර ගැනීමට හා හරියාකාර ඉටු කිරීමට තමාගේ මුදල් තත්ත්වය ප්‍රමාණවත් බව, අවශ්‍ය වුවහොත් ඔප්පු කිරීම පිණිස ඒ සම්බන්ධයෙන් ලියකියවිලි ඉදිරිපත් කිරීමට සූදානම් විය යුතුය.

3. මරදානේ දුම්රිය ගබඩා අධිකාරී තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි ෆෝරම කොළවල ටෙන්ඩරය ලියා පිටපත් දෙකක් සහිතව එවිය යුතුය.

4. ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 250ක් මරදානේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී තැනගේ කාර්යාලයේ හෝ කොළඹින් පිටත, ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1973 සැප්තැම්බර් මස 29 වැනි සෙනසුරාදා දහවල් 12.00 තෙක් ටෙන්ඩර් ෆෝරම නිකුත් කරනු ලැබේ.

5. 1973 ඔක්තෝබර් මස 3 වෙනි බදාදා පෙරවරු 11.05ට දුම්රිය මූලස්ථාන ටෙන්ඩර් කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන් පෙනී සිටීමට අවසර ඇත.

6. වැඩි විස්තර දුම්රිය ගබඩා අධිකාරී තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

එම්. සරීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

1973 අගෝස්තු මස 16 වැනි දින,
කොළඹ 10.

8-1181—73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

---

### ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

#### බදුල්ල කච්චේරිය

බදුල්ල දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1973. 09. 24 වෙනි දින පස්වරු 2.30 දක්වා බදුල්ල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත විසින් ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

| වැඩෙහි ස්වභාවය | ලියාපදිංචි විය යුතු මුදල රුපියල් |
|---|---|
| බදුලුඔය ජනපදයේ ඉ. ක. ඕ. නිවාසය අළුත්වැඩියා කිරීම ... ... | 2500 |
| නාගදීප ව්‍යාපාරයේ තිස්සපුර ජනපද නිලධාරී නිවාසය අළුත්වැඩියා කිරීම ... | 2000 |
| බදුල්ල කච්චේරියේ පිහිටි, ඉ. කො. දෙ. මිනින්දෝරු කාර්යාලය අළුත්වැඩියා කිරීම ... | 2000 |

2. ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට රජයේ දෙපාර්තමේන්තුවල කොන්ත්‍රාත් කරුවන් වශයෙන් ලියාපදිංචි වී ඇති අනුමත ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමුපකාර සමිතිවලට සහ පෞද්ගලික කොන්ත්‍රාත් කරුවන්ට 1973 සැප්තැම්බර් මස 17 වෙනි දින පස්වරු 2.30 තෙක් බදුල්ල කච්චේරියේ දී ටෙන්ඩර් ෆෝරම නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් ෆෝරම අපේක්ෂකයින් විසින් බදුල්ල කච්චේරියේ හෝ වෙනත් ඕනෑම කච්චේරියක හෝ අදාළ වැඩය වෙනුවෙන් රුපියල් 25 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් බදුල්ල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත වෙත ඉදිරිපත් කළ විට, ටෙන්ඩර් ෆෝරම නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමුපකාර සමිති ටෙන්ඩර් ෆෝරම ලබාගැනීමට මුදල් තැන්පත් කිරීම අනවශ්‍යය. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාර ගනු නොලැබේ.

4. ටෙන්ඩර් ෆෝරම සම්පූර්ණ කර, පිටපත් දෙකකින් යුක්තව ලේඛනගත තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් බහා එවන කවරයට මුද්‍රා තැබිය යුතු අතර, කවරයේ උඩ වම් කෙළවරේ වැඩෙහි නම ලියා තිබිය යුතුය. ටෙන්ඩර් ෆෝරම තැපෑලෙන් නොඑවන්නේ නම්, බදුල්ල කච්චේරියේ ඉඩම් අංශයේ ආණ්ඩුවේ සහකාර ඒජන්තගේ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

5. 1973 සැප්තැම්බර් මස 24 වෙනි දින පස්වරු 2.30 ට ඉහත කී බදුල්ල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්තගේ කාමරයේදී ටෙන්ඩර් ෆෝරම විවෘත කරනු ලැබේ.

6. තමාගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බවට ලිපියක් හෝ දැන්වීමක් ලත් පසු, යම් අයෙක් ගිවිසුම්පත් අත්සන් කිරීමට හෝ ඇප තැබීමට හෝ දින 10 ක් ඇතුළත අපොහොසත් වුවහොත්, ඔහු විසින් ටෙන්ඩර් ෆෝරම සඳහා තැන්පත් කරන ලද මුදල රාජසන්තක කරනු ලැබේ. ලියාපදිංචි වූ කම්කරු සමිති, විවිධ සේවා සමුපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිති ඇප තැබීමෙන් නිදහස්ය.

7. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් සපයන ලද ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් ටෙන්ඩර් භාරගත් බවට දැන්වීමක් හෝ වෙනයම් අන් දමකින් එම ලිපිනයට ඒ බව දැන්වීම ටෙන්ඩර්කරුට එය ලැබුණාක් මෙන් සලකනු ලැබේ.

8. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩය කරවා ගැනීමට, පුහුණු නුපුහුණු යන දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වන අතර, ඔවුහු පමණක් එසේ නියුක්ත කරනු ලබන්නාහ. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

9. කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසිය සපුරාලීමට කොන්ත්‍රාත් කරුවා යම් විධියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩුදෙනවා ඇත. එහෙත්, කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවල දී කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකඟත්වය උඩ නිශ්චිතව, ලිය විල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැකිය.

10. එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීමට තහනම් වන අතර, එකී කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සලකනු ලැබේ.

11. මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන්, පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ශ්‍රී ලංකාවේ රටවැසියෙකු ලෙස අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

12. මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණවූ ද, කම්කරුවන්ට වේතන ගෙවීම් සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින්මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූල වූ ද, වේතන ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙයි.

13. කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පතපොත පෙරෙට්ටු පොත් හා අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට ඉඩම් කොමසාරිස් විසින් විධිමත් බලය දෙනු ලැබූ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩදීමට කොන්ත්‍රාත් කරු බැඳී සිටී.

14. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු බදුල්ල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තගෙන් දැනගත හැකිය.

පී. බී. පිහිල්ලේගෙදර,
ආණ්ඩුවේ සහකාර ඒජන්ත,
බදුල්ල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත වෙනුවට.

1973 අගෝස්තු මස 18 වෙනි දින,
බදුල්ල කච්චේරියේ දී ය.

8-1254—73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

---

### ආහාර දෙපාර්තමේන්තුව

#### ප්‍රයෝජනයට ගත නොහැකි ගෝනි

කොළඹ චාමස් ධාන්‍යාගාරයේ තිබෙන 64768 ක් පමණ වූ ප්‍රයෝජනයට ගත නොහැකි ගෝනි හා රෙදිඋර මිලදී ගැනීම සඳහා ටෙන්ඩර්පත් 1973 සැප්තැම්බර් 18 වෙනි අඟහරුවාදා සවස 2 දක්වා අංක 330, යූනියන් පෙදෙසේ ආහාර දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

රුපියල් 500 ක් තැන්පත් කිරීමෙන් පසුව මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ෆෝර්ම්වල ටෙන්ඩර් පිළියෙල කළ යුතුය. ටෙන්ඩර් පිළිබඳ විස්තර වාර්තාවක් මෙම කාර්යාලයෙන් ඉල්ලුම් කළ විට ලබාගත හැකි වේ.

ආර්. කානමුත්තු,
ආහාර කොමසාරිස් වෙනුවට.

1973 අගෝස්තු මස 22 වෙනි දින,
කොළඹ, 330, යූනියන් පෙදෙසේ දී ය.

8-1250—73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

## ටෙන්ඩර් දැන්වීමයි

සාමාන්‍යාධිකාරී, ලංකා හෝටල් සංස්ථාව, 63, ජනාධිපති මන්දිරය මාවත, කොළඹ 1, විසින් පහත සඳහන් භාණ්ඩයන් සැපයීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් කැඳවනු ලැබේ. මෙම ටෙන්ඩර සමඟ සම්පලද අඩංගු විය යුතුය. ලියුම් කවරයේ වම් උඩු කෙළවරේ "රෙදිපිළි සඳහා ටෙන්ඩර" යනුවෙන් සඳහන් කර, එවිය යුතුය. 1973 සැප්තැම්බර් මස 7 වැනි දින, තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

ඇඳ ඇතිරිලි—54"×28"—සුදු

කොට්ටඋර—18"×28"—සුදු

තැප්කින්

ඩස්ටර්

ටී සර්වියට්

ලොකු තුවා "වූල්"—සුදු

පොඩි තුවා "වූල්"—සුදු

ඔස්වින් ජයවර්ධන,
සාමාන්‍යාධිකාරී වෙනුවට,
ලංකා හෝටල් සංස්ථාව.

8-1296—73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය—ටෙන්ඩර් දැන්වීමයි

කොළඹ 5, කිරුළ පාරේ, 200 වෙනි අංකය දරණ ස්ථානයෙහි වූ ලංකා ගමනා ගමන මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපති තැන විසින් "වෙල්ඩින් රොඩ්ස් (කූරු) සහ ඊට සමාන ද්‍රව්‍ය" සැපයීම සඳහාවූ සීල්තැබූ (ලෝක ව්‍යාප්ත) ටෙන්ඩර් පත්‍ර 1973 ඔක්තෝබර් මස 24 වන බදාදා පෙ. ව. 10. වන තෙක් භාරගනු ලැබේ.

දේශීය හෝ විදේශීය ටෙන්ඩර් පත්‍ර නියමිත පෝර්ම වල අනුපිට පතකින්ද යුක්ත වනසේ සකස් කොට එවිය යුතුයි. එම පෝර්ම කොළ ටෙන්ඩර් විවෘත කරන ඉහත සඳහන් දිනට පෙර දින දහවල් 12 වන තෙක් පහත සඳහන් මගේ කාර්යාලයෙන් ලබාගත හැකිය. මෙම පෝර්ම ලබා ගැනීම සඳහා කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි අංකය දරණ ස්ථානයේ, ලංකා ගමනා ගමන මණ්ඩලයේ ප්‍රධාන ගිණුම් නිලධාරී තැන වෙත ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 100 ක්ද ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් ගාස්තු වශයෙන් රු. 10 ක් එක් එක් ටෙන්ඩර් පත්‍රයක් සම්බන්ධයෙන් තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සි පත මා වෙත ඉදිරිපත් කළ යුතුයි.

වැඩි විස්තර මගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

වාණිජ කළමනාකාර තැන.
ලංකා ගමනා ගමන මණ්ඩලය.

1973 අගෝස්තු 31 වන දින,
වාණිජ අංශය,
200, කිරුළ පාර,
කොළඹ 5.

8-1242ඒ—73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

---

## රාජ්‍ය දැව සංස්ථාව

අනුරාධපුර ප්‍රදේශයෙන් දැව සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීම

පහත දැක්වෙන ප්‍රදේශයන්ගෙන් දැව සැපයීම සඳහා කොළඹ 5, වජිර පටුමග අංක 7 දරණ ස්ථානයේ, රාජ්‍ය දැව සංසථාවේ ක්‍රියාකාරී අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. ටෙන්ඩර් කිරීමට සුදුස්සෝ :

(i) රු. 100,000 හා ඊට වැඩි වටිනාකමකින් යුත් ටෙන්ඩර් සඳහා මෙම සංස්ථාවේ ලියා පදිංචි වූ 1 පෙළ කොන්ත්‍රාත්කරුවන් හා රු. 100,000 වටිනාකම දැක්වෙන පොදු ආකෘති 170හි වත්කම් සහතිකයක් ඉදිරිපත් කළහැකි අය.

(ii) රු. 50,000 වටිනාකමින් යුත් ටෙන්ඩර් සඳහා සංස්ථාවේ ලියා පදිංචි වූ 1 හා 2 පෙළ කොන්ත්‍රාත්කරුවන් හා රු. 50,000 වටිනාකම දැක්වෙන පොදු ආකෘති 170හි වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ හැකි අය.

3. පහත දැක්වෙන ප්‍රදේශයන්ගෙන් දක්වා ඇති වටිනාකමට කඳන් හා සිල්පර සැපයීම හා අනවශ්‍ය දැව මිළදී ගැනීම සඳහා ටෙන්ඩර් :—

(1) අනුරාධපුර ප්‍රදේශය

(අ) මිනිපේ කලාප අක 18—රු. 50,000.

4. පහත දැක්වෙන ප්‍රදේශයන්ගෙන් දක්වා ඇති වටිනාකමට කඳන් හා සිල්පර සැපයීම :—

(1) අනුරාධපුර ප්‍රදේශය.

(අ) හුරුළු රක්ෂිතයේ කහටගස්දිගිලිය අඩවිය කොටස රු. 50,000

(ආ) අරගන්විල වැඩබිම—රු. 100,000

(ඇ) යක්කුරේසැල්වේජ් ප්‍රදේශය—රු. 100,000

5. 1973. 09. 17 දින අ. භා. 2.00 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ඇත.

6. 1973. 09. 18 දින පූ. භා. 11.00 ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කරනු ඇත.

7. වැඩි විස්තර රාජ්‍ය දැව සංසථාවේ අනුරාධපුරයේ ප්‍රාදේශීය කළමනාකාරගෙන් හෝ කොළඹ 5, වජිර පටුමග අංක 7, දරණ ස්ථානයේ, ක්‍රියාකාරී කළමනාකරුගෙන් හෝ ලබාගත හැකිය.

සභාපති,
රාජ්‍ය දැව සංසථාව.

රාජ්‍ය දැව සංස්ථාව,
ක්‍රියාකාරී අංශය,
7, වජිර පටුමග,
කොළඹ 5.

8-1258—73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

---

## උදළු සෑදීමට අවශ්‍ය වානේ සැපයීම සඳහා ටෙන්ඩරය

1973 ඔක්තෝබර් 15 වැනි දින පෙරවරු 10 දක්වා ඉහත සඳහන් සැපයීම සඳහා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ. රු. 100 ක ආපසු ලබා ගත හැකි ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවා අවශ්‍ය ටෙන්ඩර් පෝර්ම කොළ මෙම කාර්‍යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් තැන්පත් මුදල් ටෙන්ඩරය අවසන් වන දිනට පළමු වැඩ කරන දින දහවල් 12 න් පසු භාර ගනු නොලැබේ. අවලංගු කරන ලද ටෙන්ඩර් පත් රු. 10 ක් ගෙවීමෙන් ලබා ගත හැක.

මිළට ගැනුම් කළමනාකාර.

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංසථාව,
තැ. පෙ. 670, 242, හැව්ලොක් පාර, කොළඹ 5.

8–1233—73.08,31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය.

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—කෑගල්ල කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා—උපලේඛනයේ 6 වන තීරුවේ දක්වා ඇති (දින දෙකම ඇතුලත්ව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කෑගල්ලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරිතැන විසින් භාරගනු ලැබෙ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුය.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් හා විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංක පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුර, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබා ගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත් කල් වේලා ඇතිව එවිය යුතුය.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට සැලකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා උවමනා පෝර්ම ඉහත සඳහන් දෙවන ඡේදයේ (ii) වන කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබා ගත හැක. වත්කම් විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල් අහිමි වෙන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දනගැනීමට මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

(i) රෝගියෙකුගේ සම්පූර්ණ ආහාර වේලකට සහල් අවුන්ස $3\frac{1}{2}$ ක් ඇතුළත් වන සේ බත් වේල් සැපයීමට ටෙන්ඩර්කරුවන් මිළ ගණන් දක්විය යුතුය.

(ii) අවශ්‍ය **සහල්** ආහාර කොමසාරිස් විසින් සලාක නොවන මිළට **සපයන** අතර, ඒ සඳහා ටෙන්ඩර්කරු ආහාර කොමසාරිස් විසින් විටින් විට නියෝග කරන ලද මිළට මුදල් ගෙවිය යුතුය.

පරිත්‍යාග කරන ලද සහල් හෝ නොමිළයේ **සහල්** හෝ පිසීම සඳහා කොන්ත්‍රාත්කරුට සැපයුවහොත්, ඒ සඳහා සලාක නොවන සහල් මිළට කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් මුදල් අඩු කරනු ලැබේ.

කිසියම් අවස්ථාවකදී සලාක සහල් සැපයුවහොත්, ඒ සහල් සඳහා සලාක මිළට කොන්ත්‍රාත්කරු විසින් මුදල් ගෙවිය යුතුය. ඒ අතර සලාක නොවන **සහල්** මිළේ සහ සලාක සහල් මිළේ වෙනස කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් අඩු කරගනු ලැබේ.

(iii) කුපන් භාර නොදුනහොත්, සේවකයින්ට සැපයිය යුත්තේ පාන් ය. කුපන් භාර දුනහොත් ඒ වෙනුවෙන් නොසපයනු ලබන පාන් සඳහා පහත සඳහන් පරිදි කොන්ත්‍රාත්කරුගේ වවුචරයෙන් මුදල් අඩු කරගනු ලැබේ :—

(අ) කුපන්වලට ලබාගන්නා සහල් දනට මෙන් නොමිළයේ වුවහොත්, නොසපයනු ලබන පාන්වල සම්පූර්ණ වටිනාකම අඩු කරනු ලැබේ.

(ආ) එවැනි කුපන්වලට සහල් නිකුත් කරන්නේ කොන්ත්‍රාත්කරු ගෙවන සලාක මිළට නම්, නොසපයනු ලබන පාන්වල මිළේත්, සලාක මිළේත් වෙනස අඩු කරගනු ලැබේ.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා '' සෞඛ්‍ය සේවා අධිකාරි, කෑගල්ල '' කියා එවිය යුතුය. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරෙහි එහි කවර සේවාවක් සඳහා දැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරෙහි ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයෙහි තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැකිය. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ලේකම් තැනට භාර දෙන්නේ නම් ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 4 වැනි තීරයේ සඳහන් දිනයෙහි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි දී කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කලින් පිළියෙල කරගත් දිනක ම විසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකි ය.

8. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරා ගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ '' බී '' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුව ය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි '' සී '' උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුය. එහෙත් ඒ සඳහා මුදල් ගෙවන විට ටෙන්ඩර් පත්‍රයේ මිළ ගණන හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන හෝ යන දෙකින් අඩු ගණන ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් ඒවා පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුවන්ගේ අත්සන් තබන පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා වත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩුබාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩා කර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සළසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතු ද වන්නේය. ටෙන්ඩර් පත්‍රයේ තිබෙන ගිවිසුමේ කොන්දේසි ද ටෙන්ඩර් කරුවන් විසින් සැලකිය යුතුය.

ඩී. බී. නියංගොඩ,
කෑගල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි.

සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලය,
කෑගල්ල,
1973 අගෝස්තු මස 31 වැනි දින.

උපලේඛනය

| 1 | 2 | 3 | 4 | 5 | | | | | | | | | | 6 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආයතනය | ටෙන්ඩර් තැන්පත් මුදල | ඇප තැන්පත් මුදල | ටෙන්ඩර් වසන වේලාව සහ දිනය | ආහාර වුවමනා ඉතා කිට්ටු ගණන — සේවකයින් සඳහා | | | | | ආහාර වුවමනා ඉතා කිට්ටු ගණන — ලෙඩුන් සඳහා | | | | | ටෙන්ඩර් කල යුතුව ඇති කාලය |
| | | | | බිත්තර | මාළු | හරක් මස් | කරවල | එලවලු | බිත්තර | මාළු | හරක් මස් | කරවල | එලවලු | |
| | රු. | රු. | | | | | | | | | | | | |
| දරණියගල රෝහල | ... 100... | 800... | 1973 සැප්තැම්බර් මස 25 වැනි දින පෙ.ව. 10 ට | ... 600... | 600... | 600... | 600... | 2,200... | 2,800... | 2,800... | 2,800... | 2,800... | 9,600 | 1974 ජනවාරි 01 දින සිට 1974 දෙසැම්බර් 31 දින දක්වා |
| මාවනැල්ල ප.ඒ. | ... 100... | 600... | | ... 700... | 700... | 700... | 700... | 2,600... | 1,900... | 1,900... | 1,900... | 1,900... | 8,300 | |
| හෙම්මාතගම ගැ.රෝ. | ... 100... | 400... | | ... 500... | 500... | 500... | 500... | 1,500... | 1,200... | 1,200... | 1,200... | 1,200... | 4,500 | |
| මහපල්ලේගම ගැ.රෝ. | 100... | 400... | | ... 600... | 600... | 600... | 600... | 2,200... | 1,000... | 1,000... | 1,000... | 1,000... | 3,300 | |
| බෙලිගල ගැ.රෝ. | ... 100... | 400... | | ... 400... | 400... | 400... | 400... | 1,200... | 1,200... | 1,200... | 1,200... | 1,200... | 4,500 | |
| පිංදෙනිය ගැ.රෝ. | ... 100... | 400... | | ... 400... | 400... | 400... | 400... | 1,200... | 1,000... | 1,000... | 1,000... | 1,000... | 2,700 | |
| කඳපිටපත්තු මා.නි. | ... 100... | 300... | | ... 150... | 150... | 150... | 150... | 450... | 240... | 240... | 240... | 240... | 700 | |
| අල්ගම මා.නි. | ... 100... | 300... | | ... 100... | 100... | 100... | 100... | 500... | 100... | 100... | 100... | 100... | 500 | |
| හෙට්ටිමුල්ල මා.නි. | ... 100... | 300... | | ... 100... | 100... | 100... | 100... | 500... | 200... | 200... | 200... | 200... | 1,400 | |
| බුලත්කොහුපිටිය මා.නි. | 100... | 300... | | ... 100... | 100... | 100... | 100... | 500... | 700... | 700... | 700... | 700... | 2,400 | |
| ගිහුරළකන්ද මා.නි. | ... 100... | 300... | | ... 200... | 200... | 200... | 200... | 600... | 100... | 100... | 100... | 100... | 300 | |
| මකුද්දල මා.නි. | ... 100... | 300... | | ... 150... | 150... | 150... | 150... | 350... | 200... | 200... | 200... | 200... | 600 | |
| වේරගල මා.නි. | ... 100... | 300... | | ... 100... | 100... | 100... | 100... | 400... | 100... | 100... | 100... | 100... | 300 | |
| අටාල මා.නි. | ... 100... | 300... | | ... 150... | 150... | 150... | 150... | 500... | 200... | 200... | 200... | 200... | 600 | |

8-125/31—73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

---

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව—කෑගල්ල කොට්ඨාශය

## කිළිටි රෙදි සේදීම

**සේවය සහ ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම්.**—1974 ජනවාරි මස 1 වැනි දින සිට 1974 දෙසැම්බර් 31 වන දයින් (දින දෙකම ඇතුළුව) අවසන් වන වර්ෂය තුළ, මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමුවැනි වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිළිටි රෙදි සේදීම සඳහා ලාංකිකයන් හා ලංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කෑගල්ල සෞඛ්‍ය සේවා අධිකාරි විසින් භාරගනු ලැබේ.

2. **ටෙන්ඩර් තැන්පත් මුදල.**—(i) මෙම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට, කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුලත් සංගම් සහ විවිධ සේවා සංගම් වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්ලිය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියා පදිංචි කල අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර බාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දහවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් ද තත් ආයතනයන් භාර වෛද්‍ය නිලධාරීන්ගෙන් ද ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩර්යක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි.

ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට සැලකිය යුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු ආයතන භාර වෛද්‍ය නිලධාරියාට හෝ දන්විය යුතුයි. මේ සඳහා උවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ දෙවන කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක.

වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **සෝදන කැලි ප්‍රමාණය පිළිබඳ විස්තර.**—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කැලි ප්‍රමාණය මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වැනි වගන්තියෙහි දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරි, කෑගල්ල'' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවද යන්න පැහැදිලිව සටහන් කළ යුතුවාක් මෙන්ම එහි වම් පස පහත කෙළවරෙහි ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරි/ලේකම් මහතාට (හෝ මාහට) දීමෙන් එය ලැබුනුබවට ඔහු/හෝ මවිසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 6 තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිල ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම්, එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් හැර, පිළිපැදිය යුතුද වන්නේය.

11. **අනික් විස්තර.**—(i) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලිබලය, ජලය ආදී පහසුකම් සැලසුවහොත් ඊට යන වියදම ආදිය පළාතේ ආදායම් පාලක නිලධාරි තුමා තක්සේරු කළ ගණන්වලට අනුව වවුචරයෙන් කපා ගනු ලැබේ.

(ii) **කිළිටි රෙදිවල විෂබීජ නැති කිරීම සහ එහා මෙහා ගෙන යාමේ වියදම්.**—යම් අවස්ථාවක කිළිටි රෙදි සේදීමට පළමු ඒවායේ විෂබීජ නැති කිරීම සඳහා වෙන ස්ථානයකට ගෙන යාමට සිදුවුවහොත් ඒවා එහා මෙහා ගෙන යාමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(iii) **පළාත් පාලන මණ්ඩලවල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.**—පළාත් පාලන මණ්ඩල තුළ ඇති ආයතනයකට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ, ඒ ඒ මණ්ඩලවල නීතිවලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරන ස්ථාන හිමි අයට පමණි.

(iv) ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් කොටසක් හෝ සැම කොටසක්ම ඒවා නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කළ හැකිය.

ඩී. බී. නියංගොඩ,
සෞඛ්‍ය සේවා අධිකාරී, කෑගල්ල.

1973 අගෝස්තු මස 31 වැනි දින,
කෑගල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලය.

**උපලේඛනය**

| 1<br>ආයතනය | 2<br>ටෙන්ඩර් තැන්පත් මුදල | 3<br>ඇප මුදල | 4<br>මසකට රෙදි සේදිය යුතු වාර ගණන | 5<br>මසකට සේදිය යුතු කෑලි ගණන (සාමාන්‍ය) | 6<br>ටෙන්ඩර් භාර ගැනීම අවසාන වන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| | රු. | රු. | | | |
| කරවනැල්ල දිස්ත්‍රික් රෝහල ... ... | 50 ... | 100 ... | 4 ... | 3,500 | 1973 සැප්තැම්බර් මස 25 දින පෙරවරු 10ට |
| අරණායක දිස්ත්‍රික් රෝහල ... ... | 25 ... | 100 ... | 4 ... | 1,100 | |
| වරකාපොල ප. ඒ. ... ... | 25 ... | 100 ... | 4 ... | 1,500 | |
| කෑගල්ල මූලික රෝහල—ශල්‍යාගාරය ... ... | 25 ... | 100 ... | 10 ... | 5,500 | |
| වාට්ටු අංක 3, 9 හා 8 ... ... | 25 ... | 100 ... | 6 ... | 3,000 | |
| වාට්ටු අංක 1, 2, 4, 5, 6, 7 හා වෙනත් සියලු කොටස් ... | 50 ... | 100 ... | 4 ... | 5,500 | |
| කිතුල්ගල දිස්ත්‍රික් රෝහල ... ... | 25 ... | 100 ... | 3 ... | 1,000 | |

8-1253/2—73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

---

**සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

ජාතික කිරි ව්‍යාපාරය—පිරිසිදු එළකිරි එහා මෙහා ගෙනයාම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.**—වර්ෂ 1974 ජනවාරි 1 වැනිද සිට 1974 දෙසැම්බර් 31 දක්වා (දෙදිනම ඇතුළුව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන ආයතනයන්ට, දුම්රිය ස්ථානවල/සෞඛ්‍ය කාර්යාලවල/ආණ්ඩුවේ ගොවිපළවල සිට කිරි මධ්‍යස්ථානවලට පිරිසිදු එළකිරි ගෙනයාම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම් විසින් එවනු ලබන සීල්තැබූ ටෙන්ඩර් පත්‍ර කෑගල්ලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේදී භාර ගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයෙහි දෙවන ඡෙදයෙහි සඳහන් පරිදි රු. 100 ක තැන්පත් මුදලක් මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුය.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගමවලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වෙවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිළිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනෙහි, දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වව්නියාව යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරීවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර් කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට සෑළකිය යුතු කාලයකට පළමු තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුය. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (ii) සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—ප්‍රවාහනය කළ යුතු එළකිරි ප්‍රමාණයන් දළ වශයෙන් දන ගැනීමට මේ සමග ඇති උපලේඛනයෙහි 3 වන තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "සෞඛ්‍ය සේවා අධිකාරී, කෑගල්ල" කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර්පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම, එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ලේකම් මහතාට දීමෙන් එය ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 4 වෙනි තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම් කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳව සැකයුක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු නියමිත ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ නොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටිපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය.

11. **වෙනත් විස්තර.**—තව දුරටත් විස්තර දනගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි සඳහන් අදාල කාර්යාලයකින් හෝ ඉල්ලුම් පත්‍රයක් මගින් පුළුවන.

ඩී. බී. නියංගොඩ,
කෑගල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරී.

1973 අගෝස්තු මස 31 දින,
කෑගල්ල සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේ දීය.

උපලේඛනය

| (1) සේවය | (2) ප්‍රදේශය | (3) ප්‍රමාණය දළ වශයෙන් මසකට පයින්ට්ස් | (4) අවසන් දිනය | (5) ටැන්ඩර් තැන්පත් මුදල රු. | (6) ඇප තැන්පත් මුදල රු. |
|---|---|---|---|---|---|
| 1. කෑගල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කායඝාලයේ සිට කෑගල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | කෑගල්ල | ... 10,000 | 1973 සැප්තැම්බර් 25 දින පෙ.ව. 10 ට | 100 ... | 1,000 |
| 2. ගලිගමුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කායඝාලයේ සිට ගලිගමුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | ගලිහමුව | ... 16,000 | | 100 ... | 1,350 |
| 3. මාවනැල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කායඝාලයේ සිට මාවනැල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | මාවනැල්ල | ... 15,800 | | 100 ... | 950 |
| 4. අලව්ව දුම්රිය ස්ථානයේ සිට වරකාපොල සෞඛ්‍ය වෛද්‍යනිලධාරිතැනගේ කායඝාලයට, වරකාපොල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කායඝාලයේ සිට වරකාපොල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | වරකාපොල | ... 13,000 | | 100 ... | 1,525 |
| 5. දෙහිඕවිට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කායඝාලයේ සිට දෙහිඕවිට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථාන වලට | දෙහිඕවිට | ... 4,300 | | 100 ... | 600 |
| 6. රුවන්වැල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කායඝාලයේ සිට රුවන්වැල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | රුවන්වැල්ල | ... 8,000 | | 100 ... | 1,150 |
| 7. රඹුක්කන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කායඝාලයේ සිට රඹුක්කන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | රඹුක්කන | ... 5,000 | | 100 ... | 500 |

8-1253/3—73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

---

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

කොළඹ 5, නාරාහේන්පිට නාවලපාරේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැඩපල හා යාන්ත්‍රාගාරයේ කෘෂිකර්ම ඉංජිනේරු තැන විසින් පහත සඳහන් ද්‍රව්‍ය කොළඹ 5 නාරාහේන්පිට වැඩපල හා යාන්ත්‍රාගාරයට ගෙනවිත් භාරදීම සඳහා 1973 සැප්තැම්බර් මස 14 වැනි දින සවස 3 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

ගැල්වොල්ව් ඇණ සහ මුරිච්චි $2\frac{1}{2}'' \times 5/16''$—600 ක් සැපයීම.

2. ටෙන්ඩර් පත් මුද්‍රා තැබූ කවරවල එවිය යුතු අතර, කවරයේ උඩ වම් කෙළවරේ " ගැල්වෝල්ට් ඇණ සහ මුරිච්චි සැපයීම " යන්න සඳහන් කර නියමිත වේලාවට පෙර කොළඹ 5 නාරාහේන්පිට නාවලපාරේ පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැඩපල හා යාන්ත්‍රාගාරයේ කෘෂිකර්ම ඉංජිනේරු (සැපයීම්) වෙත එවිය යුතුය.

3. ප්‍රශ්න කිරීමකින් තොරව ටෙන්ඩර්පත් පිළිගැනීමේ හෝ කොටසක් පිළිගැනීම හෝ පිළිනොගැනීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත ඇත.

4. ටෙන්ඩර්පත් දෙපිටපතකින් යුතුව එවිය යුතුය.

ජේ. කේ. පී. ප්‍රනාන්දු,
කෘෂිකර්ම ඉංජිනේරු (නිෂ්පාදන).

වැඩපල හා යන්ත්‍රාගාරය,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1728,
කොළඹ 5.
1973. 8. 20

8-1235—73.08.31 දින අංක 75 දරණ ගැසට් පත්‍රය

---

**සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—කුරුණෑගල කොට්ඨාශය**

කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම—1974

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් සහ සේවා.**—1974.01.01 සිට 1974 දෙසැම්බර් 31 වෙනිද දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවැනි තීරයෙහි සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කුරුණෑගල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කායඝාලයේ දී සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ 2 වන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුයි. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම් වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදල් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සමාගම්වල හෝ සමිතිවල ලියා පදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබා ගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාර ගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවියයුතුය. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට සැළකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුය. මේ සඳහා උවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (ii) කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබා ගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන් වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැනගැනීමට, මෙ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " සෞඛ්‍ය සේවා අධිකාරි, කුරුණෑගල " කියා එවිය යුතුයි. සීල් තබන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිළිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියා පදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය යුතුය. ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව මට හෝ ගණකාධිකාරි/ලේකම් තැනට භාර දෙන්නේ නම් ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වැනි තීරයෙහි සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

**ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර් කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර් කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර් කරුවෙකු ඉදිරිපත් කරනු ලැබූ ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමග කළින් පිළියෙල කරගත් දිනක මා විසින් හෝ බලය පවරනු ලද මාගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතුව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරා ගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝරමයේ "බී" උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝරමයෙහි "සී" උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අයකිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන හෝ එවකට වෙළඳපොලේ පවතින මිළ ගණන හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළ පවතී නම්, එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. ටෙන්ඩර්කරුවන් තමන් ඉදිරිපත් කරන මිළ ගණන්, ටෙන්ඩර් භාර ගැනීම අවසන්වන දවසේ සිට හය මාසයක් දක්වා පිළිගත හැකි සේ තබා ගත යුතුයි. ඉදිරිපත් කළ ටෙන්ඩර් පත්‍ර පසුව අස්කළ හැකි නොවේ.

10. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර් කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත්වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

11. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

12. **බඩුබාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයෙහි හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

13. (i) රෝගියෙකුගේ සම්පූර්ණ ආහාර වේලකට සහල් අවුන්ස 3¼ක් ඇතුළත් වන සේ බත් වේල් සැපයීමට ටෙන්ඩර්කරුවන් මිළ ගණන් දක්විය යුතුය.

(ii) අවශ්‍ය සහල් ආහාර කොමසාරිස් විසින් සළාක නොවන මිළට සපයන අතර, ඒ සඳහා ටෙන්ඩර්කරු ආහාර කොමසාරිස් විසින් විටින්විට නියෝග කරන ලද මිළට මුදල් ගෙවිය යුතුය.

පරිත්‍යාග කරන ලද සහල් හෝ නොමිළයේ සහල් හෝ පිසීම සඳහා කොන්ත්‍රාත්කරුට සැපයුවහොත්, ඒ සඳහා සළාක නොවන සහල් මිළට කොන්ත්‍රාත්කරුගෙන් ආහාර වවුචරයෙන් මුදල් අඩු කරනු ලැබේ.

කිසියම් අවස්ථාවක දී සලාක සහල් සැපයුවහොත්, ඒ සහල් සඳහා සලාක මිළට කොන්ත්‍රාත්කරු විසින් මුදල් ගෙවිය යුතුය. ඒ අතර සලාක නොවන සහල් මිලේ සහ සලාක සහල් මිලේ වෙනස කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් අඩුකරගනු ලැබේ.

(iii) කූපන් භාර නොදුන්හොත්, සේවකයින්ට සැපයිය යුත්තේ පාන් ය. කූපන් භාර දුනහොත් ඒ වෙනුවෙන් නොසපයනු ලබන පාන් සඳහා පහත සඳහන් පරිදි කොන්ත්‍රාත්කරුගේ වවුචරයෙන් මුදල් නඩු අඩු කරගනු ලැබේ :—

(අ) කූපන්වලට ලබා ගන්නා සහල් දනට මෙන් නොමිළයේ වුවහොත්, නොසපයනු ලබන පාන්වල සම්පූර්ණ වටිනාකම අඩු කරනු ලැබේ.

(ආ) එවැනි කූපන් වලට සහල් නිකුත් කරන්නේ කොන්ත්‍රාත්කරු ගෙවන සලාක මිළට නම්, නොසපයනු ලබන පාන්වල මිලේත්, සලාක මිලේත් වෙනස අඩු කරගනු ලැබේ.

14. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර් කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන් ම පිළිපැදිය යුතු ද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසි ද ටෙන්ඩර් කරුවන් විසින් සැලකිය යුතුය.

එච්. ජේ. ඕ. ප්‍රනාන්දු,
කුරුණෑගල සෞඛ්‍ය සේවා අධිකාරී.

1973.08.18,
සෞඛ්‍යසේවා අධිකාරී කාර්යාලය, කුරුණෑගල.

**උපලේඛණය**

| (1) ආයතනය | (2) ටෙන්ඩර් ඇප මුදල | (3) ටෙන්ඩර් තැන්පත් මුදල | (4) ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව | (5) දළ ආහාර ප්‍රමාණය — සේවකයින්ට: මාලු | මස් | කර වල | එළ වළු | බිත්තර | රෝගීන්ට: මාලු | මස් | කර වල | එළ වළු | බිත්තර | (6) ටෙන්ඩර් කළ යුතු කාලය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මහව රෝහල ... | 100 | 1,100 | | 300 | 300 | 300 | 1,000 | 300 | 3,000 | 3,000 | 3,000 | 9,000 | 3,000 | |
| මාවතගම රෝහල ... | 100 | 1,100 | | 250 | 250 | 250 | 1,000 | 250 | 3,000 | 3,000 | 3,000 | 9,000 | 3,000 | |
| පොල්පිතිගම රෝහල ... | 100 | 1,000 | | 300 | 300 | 300 | 1,000 | 300 | 2,000 | 2,000 | 2,000 | 6,000 | 2,000 | |
| අලව්ව ප.ඒ. ... | 100 | 600 | | 150 | 150 | 150 | 200 | 150 | 1,500 | 1,500 | 1,500 | 6,000 | 1,500 | |
| ගොකරැල්ල ප.ඒ. ... | 100 | 1,000 | | 300 | 300 | 300 | 2,000 | 300 | 2,000 | 2,000 | 2,000 | 6,000 | 2,000 | |
| ඕංගිරිය ප.ඒ. ... | 100 | 400 | | 400 | 400 | 400 | 1,500 | 400 | 600 | 600 | 6ා0 | 2,000 | 600 | |
| හෙට්ටිපොළ ප.ඒ. ... | 100 | 800 | | 350 | 350 | 350 | 1,500 | 350 | 1,500 | 1,500 | 1,500 | 5,000 | 1,500 | |
| කඳානෙගෙදර ප.ඒ. ... | 100 | 800 | | 350 | 350 | 350 | 1,500 | 350 | 1,000 | 1,000 | 1,000 | 3,500 | 1,000 | |
| හිරිපිටිය ප.ඒ. ... | 100 | 600 | | 150 | 150 | 150 | 1,000 | 150 | 1,000 | 1,000 | 1,000 | 3,500 | 1,000 | |
| කටුපොත ප.ඒ. ... | 100 | 1,000 | | 200 | 200 | 200 | 1,000 | 200 | 1,500 | 1,500 | 1,500 | 5,000 | 1,500 | |
| මුවන්හෙල ප.ඒ. ... | 100 | 800 | 1973 | 400 | 400 | 400 | 1,500 | 400 | 750 | 750 | 750 | 2,500 | 750 | 1974 රේ |
| නාරම්මල ප.ඒ. ... | 100 | 800 | සැප්තැම්බර් | 500 | 500 | 500 | 1,500 | 500 | 1,000 | 1,000 | 1,000 | 5,000 | 1,000 | ජනවාරි |
| අඹන්පොල ප.ඒ. ... | 100 | 800 | 25 වෙනි | 450 | 450 | 450 | 2,500 | 450 | 2,000 | 2,000 | 2,000 | 6,000 | 2,000 | මස |
| නිකවැව ප.ඒ. ... | 100 | 800 | දින | 350 | 350 | 350 | 1,500 | 350 | 1,000 | 1,000 | 1,000 | 4,000 | 1,000 | 1 වැනි ද |
| පහලගිරිබාව ප.ඒ. ... | 100 | 800 | උදේ | 500 | 500 | 500 | 1,000 | 500 | 2,000 | 2,000 | 2,000 | 6,000 | 2,000 | සිට |
| දූනකදෙණිය මා.නි. ... | 100 | 500 | 10.00 ට | 100 | 100 | 100 | 200 | 100 | 100 | 100 | 100 | 500 | 100 | 1974 රේ |
| මහමූකලන්යාය මා.නි. ... | 100 | 500 | | 250 | 250 | 250 | 1,500 | 250 | 200 | 200 | 200 | 1,000 | 200 | දෙසැම්බර් |
| සඳලංකාව මා.නි. ... | 100 | 500 | | 100 | 100 | 100 | 500 | 100 | 100 | 100 | 100 | 250 | 100 | මස |
| ඇහැටුවැව මා.නි. ... | 100 | 500 | | 250 | 250 | 250 | 1,000 | 250 | 750 | 750 | 750 | 2,000 | 750 | 31 වැනිද |
